(හත්වැනි පාර්ලිමේන්තුව — පළමුවැනි සභාවාරය)

අංක. 9(2).]

# පාර්ලිමේන්තුවේ අංක 9 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2013 අගෝස්තු මස 08 වැනි බ්‍රහස්පතින්දා**

## 2013 අගෝස්තු මස 21 වැනි බදාදා

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි,— 1985 අංක 48 දරන පනතින් හා 1987 අංක 28 දරන පනතින් සංශෝධිත, 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(3) වගන්තිය සහ 14 හා 20 වැනි වගන්ති යටතේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2013 ජුලි 18 දිනැති අංක 1819/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2013.08.07 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

විද්‍යාව හා තාක්ෂණය වැඩිදියුණු කිරීමේ (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

## 2013 සැප්තැම්බර් මස 03 වැනි අඟහරුවාදා

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2609/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) උගත් පාඩම් හා ප්‍රතිසන්ධානය පිළිබඳ වූ පරීක්ෂණ කොමිෂන් සභා වාර්තාවේ ප්‍රධාන නිරීක්ෂණ හා නිර්දේශයන්හි සාරාංශයේ 70 වැනි පිටුවේ සඳහන් ව්‍යවස්ථා පිළිබඳ අධිකරණ සමාලෝචනය සඳහා වූ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය විධිවිධාන ප්‍රමාණවත් නොවන බවට වූ සඳහනට එකඟ වන්නේද;

(ii) එම වාර්තාවේ ඇති නීතියක ව්‍යවස්ථානුකූලභාවය ශ්‍රේෂ්ඨාධිකරණය ඉදිරිපිට සාර්ථක ලෙස විමසීම සඳහා, විශේෂයෙන්ම හදිසි පනත් කෙටුම්පත් සඳහා සපයා ඇති අදාළ කාලය ඉතාම අල්ප බවට වන සඳහන පිළිගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත තත්ත්වය පිළිබඳ අවධානය යොමු කරමින් එයට පිළියම් යෙදීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම පියවර ගනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2935/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, තිහගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ බණ්ඩත්තර සිට මීදෙල්ලවෙල දක්වා ජල නළ දීර්ඝ කිරීම සඳහා 2010 නොවැම්බර් මස 28 දින සමාරම්භක උළෙලක් පැවැත්වූ බවත්,

(ii) වර්ෂ දෙකකට අධික කාලයක් ගතවී ඇතත් මේ දක්වා නළ ජලය ලබාදී නොමැති බවට ප්‍රදේශයේ ජනතාව චෝදනා කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් පානීය ජල යෝජනා ක්‍රමය සඳහා මුදල් වෙන් කර තිබේද;

(ii) එසේ නම්, වෙන්කර ඇති මුදල කොපමණද;

(iii) අවශ්‍ය අරමුදල් සපයා තිබේ නම්, මෙම ජල යෝජනා ක්‍රමය නවතා තිබීමට හේතු කවරේද;

(iv) එම ගැටලු සහගත කරුණු විසඳා ප්‍රදේශයේ ජනතාවට හැකි ඉක්මනින් පානීය ජලය සැපයීමට කටයුතු කරන්නේද;

(v) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහි ද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2998/'12

ගරු රෝසි සේනානායක මහත්මිය,— ළමා සංවර්ධන හා කාන්තා කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) වර්ෂ 2009 සිට 2012 දක්වා කාල සීමාව තුළදී,

(i) එක් එක් දිස්ත්‍රික්කය අනුව සිදුවී ඇති ළමා අපචාර සහ අපයෝජන සිද්ධීන් සංඛ්‍යාව;

(ii) එම සිදුවීම්වල ස්වභාවය අනුව එක් එක් සිදුවීම් සංඛ්‍යාව;

(iii) අදාළ සිද්ධීන්ට ගොදුරු වූ ගැහැණු ළමුන් සහ පිරිමි ළමුන් සංඛ්‍යාව;

කොපමණද යන්න වාර්ෂිකව, වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) එම සිද්ධිවලට ගොදුරු වූ ළමුන් අතරින් මව හෝ පියා විදේශගත වූ ළමුන් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3046/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවලින් කොළඹ මහ නගර සභාවට අයවිය යුතු රුපියල් කෝටි 150 ක පමණ වරිපනම් මුදලක් එම ආයතනවලින් අයකර ගැනීමට නොහැකිවී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) කොළඹ මහ නගර සභාවට එම රජයේ දෙපාර්තමේන්තු, සංස්ථා සහ ව්‍යවස්ථාපිත මණ්ඩලවලින් අය විය යුතු වරිපනම් ගාස්තු වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අදාළ වරිපනම් ගාස්තු අයකර ගැනීමට නාගරික භාණ්ඩාගාරය මෙතෙක් කටයුතු නොකිරීමට හේතු කවරේද;

(iii) එම වරිපනම් ගාස්තු අදාළ ආයතන වෙතින් කඩිනමින් අය කර ගැනීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3067/'12

ගරු අජිත් පී. පෙරේරා මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) උතුරු මැද පළාත් සභාව පිහිටුවා එහි කටයුතු ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) උතුරු මැද පළාත් සභාව විසින් මේ වන විට සම්මත කර ඇති ප්‍රඥප්ති සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් ප්‍රඥප්තියේ නම, අංකය සහ සම්මත කළ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත පළාත් සභාව මගින් සම්මත කරන ලද,

(i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවැනි උපලේඛනයේ I වැනි ලැයිස්තුවේ (පළාත් සභා ලැයිස්තුවේ) විෂයයන්වලට අදාළ ප්‍රඥප්ති;

(ii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවැනි උපලේඛනයේ III වැනි ලැයිස්තුවේ (සමගාමී ලැයිස්තුවේ) විෂයයන්වලට අදාළ ප්‍රඥප්ති;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3111/'12

ගරු රවී කරුණානායක මහතා,— මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කොළඹ කොටස් හුවමාරුවට අදාළව සිදුවන;

(i) වංචා සහගත අභ්‍යන්තර ගනුදෙනු සම්බන්ධයෙන් ආරම්භයේ සිට විමර්ශනය කොට කටයුතු කරන ලද සිද්ධීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සිද්ධීන්හි නම්, ඒ හා සම්බන්ධ මුදල් ප්‍රමාණයන් සහ ඒ සම්බන්ධව එළැඹුණු අවසාන තීරණයන් කවරේද;

(iii) කෘතිම ලෙස මිල ඉහළ යෑමට සලස්වා කොටස් අධි මිලට අලෙවිකිරීම (Pump and Dump) වැනි වෙළෙඳපළ අයුතු ලාභ චේතනාවෙන් හැසිරවීමේ කටයුතුවලට සම්බන්ධ සිද්ධීන් සංඛ්‍යාව කොපමණද;

(iv) ඉහත සිද්ධීන්ට අදාළව එම චූදිතයන්ගේ නම්, විමර්ශනය සිදු කළ දිනයන් සහ ඒ සම්බන්ධයෙන් එළැඹි අවසාන තීරණයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) කොටස් හුවමාරුවේ සිදුවන ගනුදෙනු සම්බන්ධයෙන් සමාගම් සැකයට භාජනය වූ අවස්ථා ගණන කොපමණද;

(ii) එසේ සැකයට භාජනය වූ සමාගම්වල නම් කවරේද;

(iii) එසේ එකී සමාගම් ගැන සැක පහළවීමට හේතු කවරේද;

යන්නත් පසුගිය වර්ෂ 5ට අදාළව එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) කොටස් හුවමාරුව තමන්ට වාසිදායක ලෙස අයුතු ලාභ චේතනාවෙන් හසුරුවන්නන් මගහැර යාමට තරම් පවතින නීති ප්‍රමාණවත්ද;

(ii) එසේ නොමැති නම්, එලෙස අයුතු ලාභ චේතනාවෙන් තමන්ට වාසිදායක ලෙස කොටස් ගනුදෙනු හැසිරවීම පාලනය කිරීම සඳහා ඇති විසඳුම් හා යෝජනා කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3196/'12

ගරු රන්ජන් රාමනායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වී සෞදි අරාබියේ ගෘහ සේවිකාවන් වශයෙන් සහ වෙනත් රැකියා සඳහා ගොස් ඇති ශ්‍රී ලාංකික කාන්තාවන් සහ පිරිමින් විශාල සංඛ්‍යාවක් ඉතා දුක් විඳිමින් දැනට එම රටේ "ඔලායා" රැඳවුම් කඳවුරේ සහ "ජෙඩා" පාලම යට රැඳී සිටින බවත්;

(ii) අදාළ ගිවිසුම් පරිදි සුදුසු රැකියා ස්ථාන නොලැබීම, හිංසනය සහ වැටුප් නොගෙවීම වැනි විවිධ කරුණු ඒ සඳහා හේතු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ශ්‍රී ලාංකික පිරිස වහාම මෙරටට ගෙන්වා ගැනීමට කටයුතු කරන්නේද;

(ii) ඔවුන්ගේ පවුල්වල ආරක්ෂාව, සුභසාධනය සහ ආර්ථිකය නංවාලීම සඳහා ක්ෂණිකව ක්‍රියාත්මක කළ හැකි, ප්‍රායෝගික වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3359/'12

ගරු පී. හැරිසන් මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයට අයත් ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනය යටතේ ඇති රජයේ වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) එම ආයතනවල රජයේ වාහන ලබාදී ඇති නිලධාරීන් අයත් ශ්‍රේණි කවරේද;

(iv) එම නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උක්ත අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලට කුලී පදනම මත ලබාගෙන ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහනවලට ගෙවීම් කරන ආකාරය කවරේද;

(iii) එම වාහන වෙනුවෙන් වාර්ෂිකව ගෙවන මුළු මුදල කොපමණද;

(iv) කුලී පදනම මත ලබාගත් වාහන පරිහරණය කරනු ලබන නිලධාරීන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත අමාත්‍යාංශය යටතේ ඇති රජයේ වාහන, කුලී පදනම මත ලබාගත් වාහන සහ නිලධාරීන්ගේ පුද්ගලික වාහන වෙන්කර හඳුනාගැනීමේ ක්‍රමවේදයක් තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්නේද;

(iii) අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවලට අයත් රජයේ වාහනවල රාජ්‍ය ලාංඡනය සමඟ අදාළ ආයතනයේ නම සඳහන් කර තිබේද;

(iv) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3407/'13

ගරු අජිත් කුමාර මහතා,— ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2006 සිට 2012 දක්වා කාලය තුළ ධීවර කර්මාන්තයට අදාළව ආනයනය කර ඇති,

(i) ධීවර යාත්‍රා;
(ii) ධීවර යාත්‍රා සඳහා අවශ්‍ය ද්‍රව්‍ය;
(iii) ධීවර යාත්‍රා එන්ජින්;
(iv) දැල් ආම්පන්න හෝ දැල් ආම්පන්න සඳහා අවශ්‍ය ද්‍රව්‍ය;
(v) වෙනත් ධීවර ආම්පන්න;

ප්‍රමාණය හා ඊට වැයකරන ලද මුදල කොපමණද යන්න එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත කාල සීමාව තුළදී මෙරට නිපදවන ලද;

(i) ධීවර යාත්‍රා;
(ii) ධීවර යාත්‍රා සඳහා අවශ්‍ය ද්‍රව්‍ය;
(iii) ධීවර යාත්‍රා එන්ජින්;
(iv) දැල් ආම්පන්න හෝ දැල් ආම්පන්න සඳහා අවශ්‍ය ද්‍රව්‍ය;
( v) වෙනත් ධීවර ආම්පන්න;

ප්‍රමාණය හා ඊට වැයකරන ලද මුදල කොපමණද යන්නත් වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3515/'13

ගරු වසන්ත අලුවිහාරේ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඝන අපද්‍රව්‍ය කළමනාකරණ හෝ පිලිසරු ව්‍යාපෘතියක් වෙනුවෙන් පළාත් පාලන ආයතනයකට ලැබෙන මුදල් වැය කිරීමට අදාළ නීත්‍යානුකූල ක්‍රම වේදය;

(ii) එම ක්‍රමවේදයට පරිබාහිරව මුදල් වැයකොට අක්‍රමිකතාවයක් සිදු කොට ඇත්නම්, ඒ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මාතලේ මහනගර සභාවට සුන්‍යා (SUNYA) නම් ව්‍යාපෘතියක් යටතේ කසළ කළමනාකරණය වෙනුවෙන් මූල්‍ය ප්‍රතිපාදන ලැබී තිබේද;

(ii) එසේ නම්, එම ව්‍යාපෘතිය යටතේ මුදල් ලබා දුන් දිනයන් කවරේද;

(iii) එමගින් ලබා දී ඇති මුදල කොපමණද;

(iv) එම ව්‍යාපෘතිය ආරම්භකිරීමට හා අවසන්කිරීමට යෝජිතව තිබූ දිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) කසළ කළමනාකරණ ව්‍යාපෘතියේ මුදල යෝජිත කාර්යය සඳහා යොදාගෙන තිබේද;

(ii) මේ වන විට ව්‍යාපෘතියේ ප්‍රගතිය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3595/'13

ගරු අනෝමා ගමගේ මහත්මිය,— අධ්‍යාපන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පාසල් දරුවන්ට නොමිලයේ දිවා ආහාරය සැපයීමේ වැඩසටහන සඳහා පසුගිය වර්ෂ 5 තුළ රජය වැය කළ මුදල කොපමණද;

(ii) දරුවන්ට සපයනු ලබන ආහාර වේල සම්බන්ධව තීරණය කරනු ලබන අය කවුරුන්ද;

(iii) ආහාර වේල ලබා දීමට අදාළව දෙන උපදෙස් නිසි පරිදි ක්‍රියාත්මක වන්නේද යන්න පිළිබඳ පසු විපරමක් සිදු කරන්නේද;

(iv) එසේ නම්, එය කවුරුන් විසින් සිදු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පාසල් දරුවන්ට දිවා ආහාරය ලබාදීමේ වැඩසටහන සෑහිමකට පත්විය හැකි මට්ටමකින් ක්‍රියාත්මක වන බව පිළිගන්නේද;

(ii) එසේ නම්, එලෙස පිළිගැනීම සඳහා හේතු වූ කරුණු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3634/'13

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) මාගම්පුර, මහින්ද රාජපක්ෂ වරායේ තෙල් ගබඩාකිරීමේ ටැංකි ඉදිකිරීමට අදාළව,

(i) ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කළ අවසන් සමස්ත පිරිවැය කොපමණද;

(ii) එකී ව්‍යාපෘති පිරිවැය සඳහා අරමුදල් සපයාගත් ආකාරය කවරේද;

(iii) ණය පහසුකම් ලබාගෙන තිබේ නම්, එම ණය පහසුකම්වලට අදාළ කොන්දේසි කවරේද;

(iv) මූල්‍ය ගාස්තු හා ණය පොලී ගෙවීමෙන් ද අනතුරුව එකී ව්‍යාපෘතිය මුදල් ප්‍රවාහ සමායනයක් අත් කරගන්නේ කවර දිනකද;

(v) එම එක් එක් ටැංකියේ ධාරිතාව කොපමණද;

(vi) එක් එක් ටැංකියේ ඉදිකිරීම් අවසන් කළ දිනයන් හෝ ඉදිකිරීම් අවසන් කිරීමට අපේක්ෂිත දිනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) තෙල්නැව්වලින් ගෙන ඒමට අපේක්ෂා කරන නාවික යාත්‍රා ඉන්ධන, ගුවන්යානා ඉන්ධන සහ "එල්.පී. ගෑස්" එම නැව්වලින් ගොඩ බා, ගබඩා කර ගැනීම සඳහා අවශ්‍ය කරන ටැංකි සංඛ්‍යාව කොපමණද;

(ii) අද දක්වා එකී වරායට පැමිණ, ඉහත කී ඉන්ධන වර්ග ගොඩ බා ඇති තෙල් නැව් සංඛ්‍යාව කොපමණද;

(iii) මුල් ව්‍යාපෘති වාර්තාවට අනුව එකී වරායට වර්ෂයකට පැමිණීමට අපේක්ෂිත තෙල් නැව් සංඛ්‍යාව සහ මාසයකට ගොඩබෑමට අපේක්ෂිත ඉහත කී ඉන්ධන වර්ග ප්‍රමාණය කොපමණද;

යන්නත් එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3681/'13

ගරු නිමල් විජේසිංහ මහතා,— පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) සරුසාර පොල් ඉඩම් කට්ටි කර වෙන්දේසි කිරීම දේශීය පොල් නිෂ්පාදනය අඩුවීමට හා පොල් මිල වරින්වර ඉහළ යාමට හේතුවී ඇති බැවින් එම තත්ත්වය අවම කරලීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(ii) කුඩා පොල් වතු හිමියන් දිරි ගැන්වීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(iii) පොල් සහනාධාරය ලබා දෙන ක්‍රමවේදය කවරේද;

(iv) අලුතින් පොල් වගාව ආරම්භ කරන කුඩා වතු හිමියන්ට ලබාදෙන සහන කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3698/'13

ගරු අනුර දිසානායක මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2012 වර්ෂයේදී විදුලි බිලට ඉන්ධන ගැලපුම් ගාස්තුවක් ඇතුළත් කර අය කරනු ලැබුවේද;

(ii) එසේ නම්, එම ඉන්ධන ගැලපුම් ගාස්තුව පනවන ලද දිනය කවරේද;

(iii) එම ඉන්ධන ගැලපුම් ගාස්තුව අයකිරීමට හේතු කවරේද;

(iv) එම ඉන්ධන ගැලපුම් ගාස්තුව අය කරන ලද දිනයේ සිට එක් එක් මාසය වෙනුවෙන් විදුලිබල මණ්ඩලය ලැබූ ආදායම වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ඉන්ධන ගැලපුම් ගාස්තුව තවමත් අය කරන්නේද;

(vi) නොඑසේ නම්, එය අය කිරීම අවසන් කළ දිනය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3773/'13

ගරු විජිත බේරුගොඩ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2005 වර්ෂයේ සිට මේ දක්වා කාලය තුළ 'කෘෂි නිෂ්පාදනය සඳහා අගය එකතු කිරීම සහ සැපයුම් දාමය තුළ පසු අස්වනු හානිය අවම කිරීම තුළින් කෘෂි නිෂ්පාදන සඳහා අලෙවිය ප්‍රවර්ධන කිරීම' යන වැඩසටහනෙහි අරමුණ කවරේද;

(ii) එම වැඩ සටහන යටතේ ඉටුකළ කාර්ය භාරය කවරේද;

(iii) ඉන් ජනතාවට ලැබී ඇති සහනයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) කෘෂිකාර්මික සංවර්ධනය සහ උන්නතිය උදෙසා ජාතික විශ්වවිද්‍යාල වෙතින් ලබා ගෙන ඇති සේවාවන් හා දායකත්වයන් කවරේද;

(ii) 'S. 2KR 2010—2012' වැඩසටහනින් අදහස් කරන්නේ කුමක්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

## 2013 සැප්තැම්බර් මස 04 වැනි බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2613/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මහමඩගල්ල වැව නමින් යෝජිත වාරි ව්‍යාපෘතියක් ඇති බව දන්නේද;

(ii) එම වාරි ව්‍යාපෘතිය සඳහා මුල් ගල් තැබූ දිනය කවරේද;

(iii) අද වනතෙක් මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක නොවීමට හේතු කවරේද;

(iv) ඉදිරියේදී මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන්නේද;

(v) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2787/'12

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) සරත් ෆොන්සේකා මහතා නිදහස් කරන ලද දිනය කවදා ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම සමාව දීම කොන්දේසි සහිත සමාව දීමක්ද නැතහොත් කොන්දේසි විරහිත සමාව දීමක්ද යන්නත්;

(ii) ෆොන්සේකා මහතාගේ විශ්‍රාමික අයිතිවාසිකම් සහ හමුදා නිලය නැවත ලබා දෙන ලද්දේද යන්නත්;

(iii) තවමත් එතුමාව ''ජෙනරාල්'' යන පදවි නාමයෙන් හැඳින්විය හැකිද යන්නත්;

(iv) ෆොන්සේකා මහතාට එරෙහිව උසාවියේ තවත් පොරොත්තු නඩු තිබේද යන්නත්;

(v) ජනාධිපති සමාව නිසා විභාග වීමට නියමිත එම නඩු අහෝසි වන්නේද යන්නත්;

එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) සරත් ෆොන්සේකා මහතා සමග කටයුතු කිරීම හෝ එතුමාට සහාය දීම නිසා පීඩාවට පෙළන ලද හෝ සේවය අවසන් කිරීමට ලක්වූ පොලිසියේ හෝ හමුදාවේ භටයින් සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිලධාරීන් නැවත සේවයේ පිහිටුවීම හෝ වන්දි ලබාදීම සිදුකර තිබේද;

(iii) නොඑසේ නම්, එයට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) සරත් ෆොන්සේකා මහතා නිදහස් කිරීමේ කරුණට අදාළව;

(i) ඒ පිළිබඳව සාකච්ඡා පැවැත්වූ පුද්ගලයින් කවුරුන්ද යන්නත්;

(ii) ඒ සම්බන්ධයෙන් බලපෑම් ඇති කළ රටවල් සහ එය සිදුවූයේ කවර අවස්ථාවක ද යන්නත්;

(iii) දේශපාලන සහ ආගමික නායකයින්ගේ මැදිහත් වීම් නොසලකා හැරියේ කවුරුන්ද යන්නත්;

එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

2934/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාතර දිස්ත්‍රික්කයේ, පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත්, සියඹලාගොඩ (බටහිර) ග්‍රාම නිලධාරී වසමේ පිහිටි සිංගල්දෙනිය, නියගමළහේන ඇතුළු සරු සාර කුඹුරු ඉඩම් කිහිපයක් විනාශ කරමින් කුඹුරට අවශ්‍ය නොවන ඇළ මාර්ගයක් සහ පාරක් සකස් කරන බවත්;

(ii) එම ඇළ මාර්ගය සහ පාර තැනීම සම්බන්ධයෙන් ප්‍රදේශයේ ජනතාව දැඩි විරෝධතාවයක් දක්වන බවත්;

(iii) මෙම ක්‍රියාව නිසා වර්ෂාව අඩු කාලවලදී කුඹුරු යාය විනාශ වී යාමේ අවදානමක් ඇති බවට ගොවීන් චෝදනා කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ඇළ මාර්ගය සහ පාර තැනීම සඳහා වැය කරන මුදල කොපමණද;

(ii) ඊට අවශ්‍ය ප්‍රතිපාදන සපයාගනු ලබන අරමුදල කවරේද;

(iii) ගොවීන් ප්‍රතික්ෂේප කරනු ලබන මෙම ව්‍යාපෘතිය නවතා දැමීමට හා විධිමත් පරීක්ෂණයක් සිදුකර ඊට වගකිව යුත්තන්ට එරෙහිව නීතිමය ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3063/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) දුම්රිය බලවේග කට්ටල 11ක් සහ සුඛෝපබෝගී දුම්රිය දෙකක් අඩු මිල ගණන් යටතේ ප්‍රවාහනය කිරීමට අවස්ථාව ලැබී තිබියදී ප්‍රවාහන අමාත්‍යාංශ ලේකම්වරයා නියෝජ්‍ය සභාපති ධූරය දරන සමාගමක් වෙත එම ප්‍රවාහන කටයුතු ලබාදීම නිසාවෙන් දුම්රිය දෙපාර්තමේන්තුවට විශාල අලාභයක් සිදුවී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් පරිදි දුම්රිය බලවේග කට්ටල හා සුඛෝපබෝගී දුම්රිය ප්‍රවාහනය කිරීමේ ගණුදෙනුව හේතුවෙන් දුම්රිය දෙපාර්තමේන්තුවට දැරීමට සිදු වූ අලාභය කොපමණද;

(ii) එම මූල්‍යමය අලාභය සිදුකරමින් වංචනික ලෙස කටයුතු කළ නිලධාරීන් සම්බන්ධයෙන් නිසි පියවර ගනු ලබන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3072/'12

ගරු අජිත් පී. පෙරේරා මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) නැගෙනහිර පළාත් සභාව පිහිටුවා එහි කටයුතු ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) නැගෙනහිර පළාත් සභාව විසින් මේ වන විට සම්මත කර ඇති ප්‍රඥප්ති සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් ප්‍රඥප්තියේ නම, අංකය සහ සම්මත කළ දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ඉහත පළාත් සභාව මගින් සම්මත කරන ලද,

(i) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවැනි උපලේඛනයේ I වැනි ලැයිස්තුවේ (පළාත් සභා ලැයිස්තුවේ) විෂයයන්වලට අදාළ ප්‍රඥප්ති;

(ii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවැනි උපලේඛනයේ III වැනි ලැයිස්තුවේ (සමගාමී ලැයිස්තුවේ) විෂයයන්වලට අදාළ ප්‍රඥප්ති;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3262/'12

ගරු රෝසි සේනානායක මහත්මිය,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හෝමාගම-හබරකඩ ළමා සහ මාතෘ සායන මධ්‍යස්ථානයේ නවීකරණ කටයුතු සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(ii) එකී ඇස්තමේන්තුගත මුදලින් නවීකරණ කටයුතු සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම මධ්‍යස්ථානයේ නවීකරණ කටයුතු ආරම්භ කළ හා අවසන් කළ දින කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) නවීකරණ කටයුතුවලට පෙර, ඉහත සඳහන් මධ්‍යස්ථානයේ එක් මාසයක් තුළදී පැවැත්වූ ළමා සහ මාතෘ සායන සංඛ්‍යාව කොපමණද;

(ii) එහි නවීකරණ කටයුතුවලින් පසුව, මේ වනවිට එක් මාසයකදී පවත්වනු ලබන ළමා සහ මාතෘ සායන සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3290/'12

ගරු රන්ජන් රාමනායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) කොළඹ, මරදාන ප්‍රදේශයේ පිහිටි අල් අතීස් විදේශ රැකියා ආයතනය මගින් ඩබ්ලිව්. එම්. සුරේඛා ද සිල්වා යන තරුණිය රැකියාවක් සඳහා සෞදි අරාබියට යවා ඇති බවත්;

(ii) එහිදී ඇය මිය ගොස් ඇති බවත්;

(iii) ඇය විදේශගත කිරීමට එම විදේශ රැකියා ආයතනය ව්‍යාජ පොලිස් වාර්තා ඇතුළු ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ව්‍යාජ තොරතුරු මත ඉහත සඳහන් තරුණිය විදේශගත කිරීමට ක්‍රියා කළ එම ආයතනයට විරුද්ධව ගන්නා ලද නීතිමය ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) සුරේඛා ද සිල්වා නමැත්තිය මියයාමට හේතුව මේ වන විට අනාවරණය කරගෙන තිබේද;

(ii) එසේ නම්, එම හේතුව කවරේද;

(iii) එම මරණයට අදාළ මරණ පරීක්ෂණ වාර්තාව ඉදිරිපත් කරන්නේද;

(iv) මියගිය තරුණිය වෙනුවෙන් ඇයගේ දෙමාපියන්ට හිමිවිය යුතු වන්දි මුදල් ලබාදීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3350/'12

ගරු පී. හැරිසන් මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඛණිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශයට අයත් ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනය යටතේ ඇති රජයේ වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) එම ආයතනවල රජයේ වාහන ලබාදී ඇති නිලධාරීන් අයත් ශ්‍රේණි කවරේද;

(iv) එම නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උක්ත අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලට කුලී පදනම මත ලබා ගෙන ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහනවලට ගෙවීම් කරන ආකාරය කවරේද;

(iii) එම වාහන වෙනුවෙන් වාර්ෂිකව ගෙවන මුළු මුදල කොපමණද;

(iv) කුලී පදනම මත ලබාගත් වාහන පරිහරණය කරනු ලබන නිලධාරීන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත අමාත්‍යාංශය යටතේ ඇති රජයේ වාහන, කුලී පදනම මත ලබාගත් වාහන සහ නිලධාරීන්ගේ පුද්ගලික වාහන වෙන්කර හඳුනාගැනීමේ ක්‍රමවේදයක් තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳව පැහැදිලි කිරීමක් කරන්නේද;

(iii) අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවලට අයත් රජයේ වාහන වල රාජ්‍ය ලාංඡනය සමග අදාළ ආයතනයේ නම සඳහන් කර තිබේද;

(iv) නොඑසේ නම්, එයට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම් ඒ මන්ද?

3416/'13

ගරු අජිත් කුමාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව, වාකරෙයිහි පුවේන්ද්‍රන් නිතාර්සන් යන අය අත්අඩංගුවට ගෙන බන්ධනාගාරගත කර තිබේද;

(ii) එසේ නම්, ඔහු සිටින බන්ධනාගාරය කවරේද;

(iii) ඔහු බන්ධනාගාර ගතකර සිටින්නේ සිරකරුවෙකු ලෙසද, සැකකරුවෙකු ලෙසද;

(iv) ඔහුට එරෙහිව අධිකරණයක නඩු පවරා තිබේද;

(v) එසේ නම්, නඩු පැවරූ දිනය, අදාළ අධිකරණය, නඩු අංකය හා නඩුවේ වත්මන් තත්ත්වය කවරේද;

(vi) නඩු පවරා ඇති චෝදනා කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) පුවේන්ද්‍රන් නිතාර්සන් යන අය නිදහස් කිරීමට කටයුතු කරන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3683/'13

ගරු නිමල් විජේසිංහ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2005 වර්ෂයේ සිට මේ දක්වා කාල සීමාව තුළ ක්‍රියාත්මක කළ තිරසාර කෘෂිකර්ම ජල කළමනාකරණ ව්‍යාපෘති අදියර I හා II හි අරමුණු කවරේද;

(ii) එම අරමුණු ළඟා කර ගැනීම සඳහා මෙතෙක් දරා ඇති ප්‍රයත්නයන් කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) 2012 වර්ෂයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන ලද වගා ව්‍යාපෘතීන්හි වර්තමාන තත්ත්වයන් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) කාබනික පොහොර නිෂ්පාදනය දිරි ගැන්වීමේ වැඩසටහන් තුළින් මෙතෙක් දරා ඇති ප්‍රයත්නයන් කවරේද;

(ii) ඊට අදාළව ඉදිරියේදී ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3699/'13

ගරු අනුර දිසානායක මහතා,— ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2013 පෙබරවාරි මාසය තුළ පෙට්‍රල් මෙට්‍රික් ටොන් එකක් ආනයනය කරන ලද සාමාන්‍ය මිල (CIF VALUE);

(ii) මෙට්‍රික් ටොන් එකක ආසන්න වශයෙන් අඩංගු පෙට්‍රල් ලීටර් සංඛ්‍යාව;

(iii) ඒ අනුව 2013 පෙබරවාරි මාසය තුළ පෙට්‍රල් ලීටරයක් වරායෙන් ගොඩබාන විට තිබූ සාමාන්‍ය මිල;

(iv) පෙට්‍රල් ලීටරයක් වෙනුවෙන් රජය විසින් අය කරනු ලබන එක් එක් බදු ප්‍රමාණයන්;

(v) පෙට්‍රල් ලීටරයකින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ලබන ලාභය;

(vi) පෙට්‍රල් ලීටරයක් බෙදා හැරීමේ වියදම හා අලෙවි කිරීම මඟින් පිරවුම් හල ලබන ලාභය;

කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3866/'13

ගරු මනූෂ නානායක්කාර මහතා,— පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොල් වගාවට හානි කරන මයිටා උවදුර සම්පූර්ණයෙන් නැති කිරීම සඳහා හෝ අවම කිරීම සඳහා අමාත්‍යාංශය මගින් දැනටමත් ගෙන ඇති පියවර කවරේද;

(ii) එම ක්‍රියාමාර්ග තුළින් යහපත් ප්‍රතිඵල ලැබී තිබේද;

(iii) එම ක්‍රියාමාර්ග අසාර්ථක නම්, ඉදිරියේදී ගැනීමට යෝජිත ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3867/'13

ගරු කනක හේරත් මහතා,— පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන පොල් වගා කිරීමේ මණ්ඩලය හා ශ්‍රී ලංකා පොල් පර්යේෂණ ආයතනය වැනි ආයතනවලට අයත් පැළ තවාන්වලින් බිහිවන පොල් පැළ පොදු ජනතාව අතට පත්වන ක්‍රමවේදය කුමක්ද යන්න එතුමා මෙම සභාවට සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පොල්පැළ ජනතාවට ලබාදීමේ වැඩපිළිවෙළ වෙනත් ආයතන හෝ වැඩසටහන් හෝ හරහා ක්‍රියාත්මක වන්නේ නම්, එම ආයතන හා වැඩසටහන් කවරේද;

(ii) ගතවූ ආසන්න වර්ෂ 05 ක කාලය තුළ එම එක් එක් ආයතනය හා වැඩසටහන යටතේ නිකුත් කළ පොල් පැළ සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3870/'13

ගරු ශෙහාන් සේමසිංහ මහතා,— පොල් සංවර්ධන හා ජනතා වතු සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) පොල් වගා කිරීමේ මණ්ඩලයේ ව්‍යාපෘතියක් වන "කප්රුක පුරවර" වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන පැළ තවාන් සඳහා බීජ පොල් ලබා ගන්නා ආකාරය කවරේද;

(ii) බීජ පොල් ලබා ගැනීම සඳහා විශේෂිත පොල්ගස් හඳුනාගෙන තිබේද;

(iii) එසේ නම්, එම ගස් හඳුනාගැනීම සිදුකළ අය කවුරුන්ද;

(iv) මේ වන විට හඳුනාගෙන ඇති බීජ පොල් ලබාගන්නා ගස් සංඛ්‍යාව කොපමණද;

(v) කප්රුක පුරවර වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන පොල් පැළ තවාන්වල මේ වන විට තවාන් කර ඇති බීජ පොල් සංඛ්‍යාව කොපමණද;

(vi) එම එක් එක් බීජ පොල් පැළ තවාන පිහිටා ඇති ස්ථාන කවරේද;

(vii) එම තවාන්වලින් ලබාගන්නා වගා කිරීමට සුදුසු තත්ත්වයේ ඇති පොල් පැළ සම්බන්ධයෙන් ගනු ලබන ඊළඟ පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3917/'13

ගරු තලතා අතුකෝරල මහත්මිය,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පදිංචි පවුල් සංඛ්‍යාව ;

(ii) ඒ අතරින් පර්චසයක හෝ ඉඩම් ප්‍රමාණයක් හිමි පවුල් සංඛ්‍යාව;

(iii) එකී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඇති රජයට අයත් මුළු ඉඩම් ප්‍රමාණය;

(iv) එම ඉඩම් අතරින් ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට අයත් ඉඩම් ප්‍රමාණය;

(v) පිටස්තර ප්‍රදේශවලින් ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට පැමිණ සිටින අය සඳහා එම ප්‍රදේශයෙන් ලබාදී ඇති රජයේ ඉඩම් හෝ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට අයත් ඉඩම් ප්‍රමාණය;

කොපමණද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 සැප්තැම්බර් මස 05 වැනි බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2614/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්පිතිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, හක්වටුනාව නමින් වාරි ව්‍යාපෘතියක් තිබේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) හක්වටුනාව වාරි ව්‍යාපෘතිය යටතේ,

(i) අස්වද්දන කුඹුරු අක්කර ප්‍රමාණය කොපමණද;

(ii) ප්‍රතිලාභ ලබන ගොවි පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) යල මහ දෙකන්නයේම වගා කටයුතු සඳහා ජලය ලබා ගැනීමට හැකියාව තිබේද;

(iv) එම හැකියාව නොමැති නම්, එසේ කිරීමට හැකිවන පරිදි හක්වටුනාව වාරි ව්‍යාපෘතිය වැඩි දියුණු කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2897/'12

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ලසන්ත වික්‍රමතුංග මහතා ඝාතනය කරන ලද්දේ කවදාද;

(ii) එම ඝාතනය පිළිබඳ විමර්ශනය මෙහෙය වූ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරී කණ්ඩායම කවරේද;

(iii) මෙම කාරණය සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවෙන් අනුයුක්ත කොට සිටි නිලධාරියා කවරෙක්ද;

(iv) මෙම ඝාතනය සම්බන්ධයෙන් අත්අඩංගුවට ගනු ලැබූ පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත කී ඝාතන සිද්ධිය විමර්ශනයේදී යම් උදාසීන බවක් පවතින බවත්;

(ii) කවර හෝ හේතුවක් මත රජයට මෙම මිනීමැරුම් සිද්ධිය යටපත් කිරීමට අවශ්‍ය වී ඇති බවත්;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2989/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යාතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ, ලාහුගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පානම ශාස්ත්‍රවෙල ප්‍රදේශයේ වනාන්තර හා කෘෂිකාර්මික බිම් අක්කර 1220 ක ප්‍රමාණයක් නාවික හමුදාව හා විශේෂ කාර්ය බලකාය විසින් අත්පත්කර ගෙන තිබෙන බවත්;

(ii) එම භූමියේ රණවිරු ගම්මානයක්, නාවික හමුදා කඳවුරක් හා හෝටල් සංකීර්ණයක් ඉදිකිරීමට සැලසුම්කර ඇති බවත්;

(iii) එම භූමියෙහි පිහිටා ඇති බැලුම්කාරාරාම විහාරය ඇතුළු තවත් පුරාවිද්‍යාත්මක ස්ථානවලට ඇතුළුවීම ජනතාවට තහනම්කර ඇති බවත්;

(iv) එකී ඉඩම් අත්පත් කර ගැනීම නිසා ප්‍රදේශයේ ජන ජීවිතයට සහ ස්වභාවික පරිසරයට දැඩි බලපෑමක් එල්ලවී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ඉඩම් අත්පත්කර ගැනීම සඳහා නීත්‍යානුකූල අවසරයක් ලබාගෙන තිබේද;

(ii) එම ඉඩම් අත්පත්කර ගැනීම නිසා ඉඩම් හා දේපල අහිමි වන ජනතාවට නැවත ඉඩම් හෝ වන්දි ලබාදීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2997/'12

ගරු රෝසි සේනානායක මහත්මිය,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2009 සිට 2012 දක්වා කාල සීමාව තුළ අධිකරණයට ඉදිරිපත්ව ඇති සමස්ත ළමා අපචාර හා අපයෝජන නඩු සංඛ්‍යාව කොපමණද;

(ii) එම නඩු අතුරින් මේ වන විට විභාග වෙමින් පවතින සංඛ්‍යාව සහ විභාග කොට අවසන් කර ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2009 සිට මේ දක්වා විභාග කළ ළමා අපචාර හා අපයෝජන නඩුවලදී වරදකරුවන් වී දඬුවම් ලැබූ සංඛ්‍යාව කොපමණද;

(ii) ළමා අපචාර හා අපයෝජන සිද්ධි සම්බන්ධයෙන් වරදකරුවන් වූවන්ට ලබා දෙන උපරිම දඬුවම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3061/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) කලුතර දිස්ත්‍රික්කයේ, හොරණ, මතුගම සහ කලුතර යන අධ්‍යාපන කලාපවලට අයත් පාසල් රැසක ගොඩනැගිලි ඉදිකිරීම් කටයුතු මුදල් නොමැතිකමින් නතර කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත අධ්‍යාපන කලාප තුළ ඇති අඩක් නිමකරන ලද ගොඩනැගිලි සහිත පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා රජය විසින් වෙන්කරන ලද මුදල්වලට සිදුවූයේ කුමක්ද;

(iii) එම පාසල්වල පවතින අඩක් නිමකළ ගොඩනැගිලිවල ඉදිකිරීම් සම්පූර්ණ කිරීම සඳහා තවදුරටත් අවශ්‍යවන මුදල කොපමණද;

(iv) අදාළ මුදල් ප්‍රතිපාදන කඩිනමින් වෙන්කොට එම පාසල් ගොඩනැගිලිවල ඉදිකිරීම් සම්පූර්ණ කරදීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3351/'12

ගරු පී. හැරිසන් මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයට අයත් ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනය යටතේ ඇති රජයේ වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) එම ආයතනවල රජයේ වාහන ලබාදී ඇති නිලධාරීන් අයත් ශ්‍රේණි කවරේද;

(iv) එම නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උක්ත අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලට කුලී පදනම මත ලබාගෙන ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහනවලට ගෙවීම් කරන ආකාරය කවරේද;

(iii) එම වාහන වෙනුවෙන් වාර්ෂිකව ගෙවන මුළු මුදල කොපමණද;

(iv) කුලී පදනම මත ලබාගත් වාහන පරිහරණය කරනු ලබන නිලධාරීන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත අමාත්‍යාංශය යටතේ ඇති රජයේ වාහන, කුලී පදනම මත ලබාගත් වාහන සහ නිලධාරීන්ගේ පුද්ගලික වාහන වෙන්කර හඳුනාගැනීමේ ක්‍රමවේදයක් තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්නේද;

(iii) අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවලට අයත් රජයේ වාහනවල රාජ්‍ය ලාංඡනය සමඟ අදාළ ආයතනයේ නම සඳහන් කර තිබේද;

(iv) නොඑසේ නම්, එයට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම් ඒ මන්ද?

3686/'13

ගරු රන්ජන් රාමනායක මහතා,— විදේශ රැකියා ප්‍රවර්ධන හා සුබසාධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුවේට් රාජ්‍යයේ රැකියා සඳහා ගොස් ඇති ශ්‍රී ලාංකික කාන්තාවන් 300කට වැඩි පිරිසක් එහිදී ඔවුන්ට මුහුණපෑමට සිදුවී ඇති විවිධ තාඩන, පීඩන සහ අතවර හේතුවෙන් සේවා ස්ථානවලින් පැනයාම නිසා වෙනත් කිසිදු චෝදනාවක් නොමැතිව පොලිස් අත්අඩංගුවේ සහ සිර කඳවුරුවල රඳවාගෙන සිටින බවත්;

(ii) එලෙස කරදර හිරිහැරවලට ලක්ව සිටින ශ්‍රී ලාංකික ශ්‍රමිකයින්ගේ දුක් ගැනවිලි සම්බන්ධයෙන් සොයාබලා ක්‍රියාකිරීම සඳහා කුවේට්හි ශ්‍රී ලංකා තානාපති කාර්යාලයට අනුයුක්ත කර ඇති ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නිලධාරීන්ගෙන් එම ගැටලු විසඳීම සඳහා ක්‍රමවත්, කඩිනම් ප්‍රතිචාරයන් නොලැබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) දැනට ක්වේට් රාජ්‍යයේ කඳවුරුවල රඳවා සිටින පිරිස් කඩිනමින් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමට කටයුතු කරන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3775/'13

ගරු විජිත බේරුගොඩ මහතා,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) හදිසි නීතිය යටතේ උතුරු හා නැගෙනහිර පළාත් ඒකාබද්ධ කරනු ලැබූ දිනය කවරේද;

(ii) එසේ ඒකාබද්ධ කිරීමට තුඩු දුන් හේතු කවරේද;

(iii) එසේ ඒකාබද්ධ කරන ලද උතුරු හා නැගෙනහිර පළාත්, පළාත් දෙකක් වශයෙන් නැවත ප්‍රකාශයට පත් කරනු ලැබූ දිනය කවරේද;

(iv) එම පළාත් වෙන් කිරීම, ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දුවකින් පසුව සිදුකරනු ලැබුවේද;

(v) නොඑසේ නම්, එවැනි නඩු තීන්දුවක් ලැබීමට පෙර එසේ කරනු ලැබුවේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2615/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, මල්ලවපිටිය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ, දොරටියාව සිට කෝන්පල දක්වා මාර්ගය දැඩි ලෙස අබලන් වී ඇති බවත්;

(ii) එම හේතුවෙන් ප්‍රදේශවාසීන් විශාල පිරිසක් අපහසුතාවට පත්වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් මාර්ගය පිළිසකර කිරීමට පියවර ගන්නා දිනය කවරේද;

(ii) ඒ සඳහා වැයවන මුළු මුදල කොපමණද;

(iii) එම මාර්ගය පිළිසකර කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන නිදහස් කිරීමට කටයුතු කරන දිනය කවරේද;

(iv) මෙම මාර්ගය පිළිසකර කිරීම අවසන්කර ජනතාව අතට පත්කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2937/'12

ගරු රවි කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2011 සහ 2012 වර්ෂවලදී පවත්වන ලද ජන සංගණනය සඳහා දරන ලද සමස්ත වියදම කොපමණද;

(ii) ඉහත සංගණනයේදී තොරතුරු ලබා ගැනීම සඳහා සේවයෙහි යොදවන ලද පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(iii) සිංහල, දෙමළ, මුස්ලිම්, මැලේ, බර්ගර් සහ වෙනත් යනාදී වශයෙන් ජනවාර්ගික කන්ඩායම් පදනමින් රටෙහි ජනගහනය කොපමණද;

(iv) බෞද්ධ, ක්‍රිස්තියානි (සෑම නිකායක්ම) හින්දු, ඉස්ලාම් වශයෙන් ආගමික පදනමින් රටෙහි ජනගහනය කොපමණද;

(v) එක් එක් දිස්ත්‍රික්කයෙහි ඇති නිවාස සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ජනගහන සහ නිවාස සංගණනයෙහි දත්ත සුපිරික්සීම (data scanning) පිණිස වන ප්‍රසම්පාදනය සම්බන්ධයෙන්;

(i) ප්‍රසම්පාදනය ලැබූ ලංසුකරු කවරේද;

(ii) එක් එක් ප්‍රසම්පාදනය සඳහා ඉදිරිපත් කල මිල ගණන් වෙන් වෙන්ව දක්වමින්, එම ප්‍රසම්පාදනය සඳහා මිල ගණන් ඉදිරිපත් කල අනෙකුත් ලංසුකරුවන්ගේ නම් කවරේද;

(iii) කැබිනට් අමාත්‍ය මණ්ඩලය විසින් පත් කරන ලද ප්‍රසම්පාදන මණ්ඩලයේ සාමාජිකයින්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2990/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කෑගල්ල දිස්ත්‍රික්කයේ, කිතුල්ගල, කැලණිවැලි රක්ෂිතයට අයත් වනසංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ පාලනයවන මාකන්දූව රක්ෂිතය හරහා කිතුල්ගල සිට පල්ලෙබාගෙ දක්වා මාර්ගයක් ඉදිකරනු ලබන බවත්;

(ii) එම මාර්ගය ඉදිකිරිම නිසා දැඩි පාරිසරික හානියක් සිදුවන බවට පරිසරවේදීන් චෝදනා කරන බවත්;

(iii) සිදුවන පරිසර හානිය වැලැක්වීම සඳහා එම මාර්ගයේ ඉදිකිරීම් කටයුතු නතර කරන ලෙස ප්‍රදේශවාසීන් ඉල්ලා සිටින බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මාකන්දූව රක්ෂිතය හරහා ඉහත සඳහන් මාර්ගය ඉදිකිරිමට නීත්‍යානුකූලව අවසර ලබා ගෙන තිබේද;

(ii) සිදුවන පරිසර හානිය සහ ඊට අදාළ ජනතා විරෝධය සලකා එම මාර්ගයේ ඉදිකිරීම් කටයුතු නතර කිරිමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3254/'12

ගරු අකිල විරාජ් කාරියවසම් මහතා,— ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මෑතකදී ලැප්ටොප් පරිගණක ලබාදුන් ජනමාධ්‍යවේදීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ජනමාධ්‍යවේදීන්ගේ නම් ලැයිස්තුවක් ඉදිරිපත් කරන්නේද;

(iii) එම ලැප්ටොප් පරිගණක ලබාදීමට ජනමාධ්‍යවේදීන් තෝරා ගන්නා පදනම කවරේද;

(iv) එම එක් පරිගණකයක මිල කොපමණද;

(v) මේ දක්වා බෙදා දී ඇති ලැප්ටොප් පරිගණක සඳහා වැයකර ඇති සමස්ත මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3267/'12

ගරු රෝසි සේනානායක මහත්මිය,— පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පෞද්ගලික අංශයෙන් කොළඹ මහ නගර සභාවට අයවිය යුතු සමස්ත හිඟ වරිපනම් බදු මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) 2012 වර්ෂය වෙනුවෙන් එම නගර සභාවට අයවිය යුතුව තිබූ සමස්ත වරිපනම් බදු මුදල් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3352/'12

ගරු පී. හැරිසන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනය යටතේ ඇති රජයේ වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) එම ආයතනවල රජයේ වාහන ලබාදී ඇති නිලධාරීන් අයත් ශ්‍රේණි කවරේද;

(iv) එම නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උක්ත අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලට කුලී පදනම මත ලබාගෙන ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහනවලට ගෙවීම් කරන ආකාරය කවරේද;

(iii) එම වාහන වෙනුවෙන් වාර්ෂිකව ගෙවන මුළු මුදල කොපමණද;

(iv) කුලී පදනම මත ලබාගත් වාහන පරිහරණය කරනු ලබන නිලධාරීන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත අමාත්‍යාංශය යටතේ ඇති රජයේ වාහන, කුලී පදනම මත ලබාගත් වාහන සහ නිලධාරීන්ගේ පුද්ගලික වාහන වෙන්කර හඳුනාගැනීමේ ක්‍රමවේදයක් තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්නේද;

(iii) අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවලට අයත් රජයේ වාහනවල රාජ්‍ය ලාංඡනය සමග අදාළ ආයතනයේ නම සඳහන් කර තිබේද;

(iv) නොඑසේ නම්, එයට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද ?

(ඈ) නොඑසේ නම් ඒ මන්ද?

2616/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ, වැල්ලව, හදිරවලාන හරහා බුදුනාපිටිය දක්වා දිවෙන මාර්ගය දැඩි ලෙස අබලන් වී ඇති බවත්;

(ii) එම හේතුවෙන් ප්‍රදේශවාසීන් විශාල පිරිසක් අපහසුතාවට පත්වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් මාර්ගය පිළිසකර කිරීමට පියවර ගන්නා දිනය කවරේද;

(ii) ඒ සඳහා වැයවන මුළු මුදල කොපමණද;

(iii) එම මාර්ගය පිළිසකර කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන නිදහස් කිරීමට කටයුතු කරන දිනය කවරේද;

(iv) මෙම මාර්ගය පිළිසකර කිරීම අවසන්කර ජනතාව අතට පත්කරන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2013 සැප්තැම්බර් මස 06 වැනි සිකුරාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

2546/'12

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (4)

(අ) (i) 2009 වර්ෂයේ සිට මේ දක්වා ශ්‍රී ලංකා යුද හමුදාවට, ගුවන් හමුදාවට සහ නාවික හමුදාවට ආහාර සැපයීම සිදුකරනු ලබන පුද්ගලයන් හා ආයතන වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) එම පුද්ගලයන් හා ආයතන තෝරා ගැනීමේදී ටෙන්ඩර් කැඳවීමක් සිදු කළේද;

(iii) එසේ නම්, ඒ සඳහා ටෙන්ඩර් ඉදිරිපත් කරන ලද පුද්ගලයන් හා ආයතන කවරේද;

(iv) එම එක් එක් පුද්ගලයා හෝ ආයතනය විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන් කවරේද;

(v) තෝරාගනු ලැබූ පුද්ගලයන් හා ආයතන විසින් ඉදිරිපත් කරන ලද මිල ගණන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2617/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මහින්ද චින්තන වැඩපිළිවෙළ යටතේ පානීය ජල ප්‍රශ්නය විසඳීම සඳහා දිස්ත්‍රික්ක මට්ටමින් ව්‍යාපෘතීන් ක්‍රියාත්මක වන්නේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මාතර, දෙව්නුවර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ දෙව්සිරිගම ගම්මානයේ පවුල් හතලිහක පමණ සංඛ්‍යාවකට උග්‍ර පානීය ජල හිඟයක් ඇති බව දන්නේද;

(ii) එම ගම්මානයේ ජනතාවගේ පානීය ජල ප්‍රශ්නය විසඳීම සඳහා නල ජල ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2942/'12

ගරු රවි කරුණානායක මහතා,— ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමෘද්ධි ප්‍රතිලාභීන් වෙනුවෙන් අයවැය මගින් වෙන් කරන ලද මුදල් ප්‍රමාණයන් කවරේද;

(ii) සමෘද්ධිලාභී ගෘහස්ථයක් වෙත ගෙවනු ලැබූ මුදල කොපමණද;

(iii) සමෘද්ධි ප්‍රතිලාභ ගෙවීමට දැරූ තථ්‍ය වියදම කොපමණද;

(iv) ඉහත සඳහන් තථ්‍ය වියදම් සිදුකරන ලද්දේ කවර ශීර්ෂ යටතේද;

(v) සමෘද්ධි ප්‍රතිලාභීන් වෙනුවෙන් වැය කරන ලද මුදල සහ මුදල පවරනු ලැබූ ශීර්ෂ කවරේද යන්න මාසික පදනමින්;

(vi) සමෘද්ධි දීමනාව වෙනුවෙන් වෙන් කරන ලද මුදල් පැවරූ අයවැය ශීර්ෂ කවරේද යන්න වාර්ෂික පදනමින්;

2010, 2011 සහ 2012 වර්ෂ සඳහා වෙන් වෙන් වශයෙන් එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2991/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2010 මැයි සිට 2012 මැයි දක්වා ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාවේ සභාපතිත්වය දැරූ පුද්ගලයගේ අධ්‍යාපනික හා වෘත්තිය සුදුසුකම් කවරේද;

(ii) ඔහුට එම තනතුරට අදාළව මාසිකව ගෙවනු ලබන වැටුප්, දීමනා හා වෙනත් වරප්‍රසාද කවරේද;

(iii) ඔහු ගෘහස්ථ මෙහෙකරුවන් දෙදෙනෙකු සේවයේ යොදවා ඇති බවට ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කර සංස්ථාවේ මුදලින් මසකට රුපියල් 35000.00ක මුදලක් ලබා ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතු ඕපල්ගල වතුයායේ අක්කර 250 ක පමණ සශ්‍රීක එනසාල් ඉඩමක් කිසිදු ප්‍රසිද්ධ දැන්වීමකින් තොරව "සසිකි" නමැති පුද්ගලික සමාගමකට ලබාදී ඇති බවත්;

(ii) ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව සතු වූ 32-606 හා 32-611 ජීප් රථ දෙක රහසිගතව සභාපතිවරයා විසින් විකුණා ඇති බවට එහි සේවකයින් චෝදනා කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) ඉහත (ආ)(ii) හි සඳහන් වාහන අලෙවි කර ඇත්නම්, ඒවා මිලදී ගත් අයගේ නම්, ලිපිනයන් හා විකුණන ලද වටිනාකම් කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3268/'12

ගරු රෝසි සේනානායක මහත්මිය,— රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිවයිනේ සෑම ග්‍රාම නිලධාරී වසමක් සඳහාම ''සේවා පියස'' කාර්යාලය බැගින් ඉදිකිරීමට පියවර ගෙන තිබේද;

(ii) ඒ සඳහා වෙන් කොට ඇති මුදල කොපමණද;

(iii) ''සේවා පියස'' එක් කාර්යාලයක් ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු මුදල කොපමණද;

(iv) ''සේවා පියස'' පළමු කාර්යාලය ඉදි කරනු ලබන්නේ කවදාද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3353/'12

ගරු පී. හැරිසන් මහතා,— වරාය හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වරාය හා මහාමාර්ග අමාත්‍යාංශයට අයත් ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනය යටතේ ඇති රජයේ වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) එම ආයතනවල රජයේ වාහන ලබාදී ඇති නිලධාරීන් අයත් ශ්‍රේණි කවරේද;

(iv) එම නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උක්ත අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලට, කුලී පදනම මත ගෙන ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහනවලට ගෙවීම් කරන ආකාරය කවරේද;

(iii) එම වාහන වෙනුවෙන් වාර්ෂිකව ගෙවන මුළු මුදල කොපමණද;

(iv) කුලී පදනම මත ලබාගත් වාහන පරිහරණය කරනු ලබන නිලධාරීන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත අමාත්‍යාංශය යටතේ ඇති රජයේ වාහන, කුලී පදනම මත ලබාගත් වාහන සහ නිලධාරීන්ගේ පුද්ගලික වාහන වෙන්කර හඳුනාගැනීමේ ක්‍රමවේදයක් තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්නේද;

(iii) අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවලට අයත් රජයේ වාහනවල රාජ්‍ය ලාංඡනය සමඟ අදාළ ආයතනයේ නම සඳහන් කර තිබේද;

(iv) නොඑසේ නම්, එයට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

2618/'12

ගරු සජිත් ප්‍රේමදාස මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අම්පාර දිස්ත්‍රික්කයේ පවතින විරැකියා අනුපාතය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස අනුව, වෙන් වෙන් වශයෙන්කොපමණද;

(ii) එම රැකියා වියුක්තිය සඳහා ලබාදෙන විසඳුම් කවරේද;

(iii) එම විසඳුම් මගින් සපුරාගැනීමට අපේක්ෂිත ඉලක්කයන් කවරේද;

(iv) එම ඉලක්කයන් සපුරාගැනීමට ගතවන කාල වකවානුව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2944/'12

ගරු රවී කරුණානායක මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධ ශාසන හා ආගමික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2010, 2011 සහ 2012 වර්ෂ සඳහා,

(i) අවි ආයුධ සහ උණ්ඩ සඳහා අයවැයෙන් වෙන් කළ තථ්‍ය මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) අවි ආයුධ සහ උණ්ඩ වෙනුවෙන් වැය කළ තථ්‍ය මුදල් ප්‍රමාණ කවරේද;

(iii) ඉහත කී මුදල් සැබෑ ලෙස වැය කළේ කවර වැය ශීර්ෂ යටතේද;

(iv) අවි ආයුධ සහ උණ්ඩ වෙනුවෙන් මාසිකව වැය කළ මුදල් ප්‍රමාණය සහ එකී මුදල් පවරනු ලැබූ වැය ශීර්ෂයන් කවරේද;

(v) අවි ආයුධ සහ උණ්ඩ සඳහා අයවැයෙන් වෙන්කළ මුදල් පවරනු ලැබූ ශීර්ෂ කවරේද;

යන්න එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2992/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— උසස් අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2008 සිට 2011 දක්වා කාල සීමාව තුළ ව්‍යාපාර පරිපාලනවේදී උපාධිය හැදෑරීම සඳහා පේරාදෙණිය විශ්වවිද්‍යාලයට සිසුන් කණ්ඩායම් හතරක් බඳවා ගත් බවත්;

(ii) මෙම ශිෂ්‍යයන් සඳහා වෙනම කළමණාකරන පීඨයක් මෙතෙක් ස්ථාපිත කර නොමැති බවත්;

(iii) මෙම උපාධිය හැදෑරිම සඳහා බඳවා ගන්නා සංඛ්‍යාව 2012 වර්ෂයේදී සිසුන් 50 දක්වා අඩුකර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කළමණාකරන පීඨයක් සඳහා වෙනම ගොඩනැගිල්ලක් මේ වන විට ඉදිවෙමින් පවතින්නේද;

(ii) එසේ නම්, එම ගොඩනැගිල්ලේ වැඩ කඩිනමින් අවසන් කිරිමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3354/'12

ගරු පී. හැරිසන් මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයට අයත් ආයතන සංඛ්‍යාව කොපමණද;
(ii) එම එක් එක් ආයතනය යටතේ ඇති රජයේ වාහන සංඛ්‍යාව කොපමණද;
(iii) එම ආයතනවල රජයේ වාහන ලබාදී ඇති නිලධාරීන් අයත් ශ්‍රේණි කවරේද;
(iv) එම නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උක්ත අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලට කුලී පදනම මත ලබා ගෙන ඇති වාහන සංඛ්‍යාව කොපමණද;
(ii) එම වාහනවලට ගෙවීම් කරන ආකාරය කවරේද;
(iii) එම වාහන වෙනුවෙන් වාර්ෂිකව ගෙවන මුළු මුදල කොපමණද;
(iv) කුලී පදනම මත ලබාගත් වාහන පරිහරණය කරනු ලබන නිලධාරීන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත අමාත්‍යාංශය යටතේ ඇති රජයේ වාහන, කුලී පදනම මත ලබාගත් වාහන සහ නිලධාරීන්ගේ පුද්ගලික වාහන වෙන්කර හඳුනාගැනීමේ ක්‍රමවේදයක් තිබේද;
(ii) එසේ නම්, ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්නේද;
(iii) අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවලට අයත් රජයේ වාහනවල රාජ්‍ය ලාංඡනය සමඟ අදාළ ආයතනයේ නම සඳහන් කර තිබේද;
(iv) නොඑසේ නම්, එයට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම් ඒ මන්ද?

3621/'13

ගරු රෝසි සේනානායක මහත්මිය,— ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ජාත්‍යන්තර ක්‍රීඩා පිටියක් වන මොරටුව ද සොයිසා ක්‍රීඩාංගනයේ අවසන් වරට ජාත්‍යන්තර ක්‍රීඩා තරඟයක් පැවැත්වූ වර්ෂය හා දිනය කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ක්‍රීඩාංගනය ගරා වැටීමේ තත්ත්වයට පත්වීමට හේතු කවරේද;
(ii) එහි පාලනය භාරවී ඇති පාර්ශ්වය කවරේද;
(iii) එහි ප්‍රතිසංස්කරණ කටයුතු අරඹා තිබේද;
(iv) එසේ නම්, එම ප්‍රතිසංස්කරණ කටයුතු සිදුකරනු ලබන ආයතනය හෝ පාර්ශ්වය කවරේද;
(v) ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2945/'12

ගරු රවී කරුණානායක මහතා,— ආපදා කළමනාකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2010, 2011 සහ 2012 වර්ෂ සඳහා,

(i) ආපදා කළමනාකරණය සඳහා අයවැයෙන් වෙන්කළ මුදල් ප්‍රමාණය කොපමණද;

(ii) ආපදා කළමනාකරණය වෙනුවෙන් වැය කළ තථ්‍ය මුදල් ප්‍රමාණය කොපමණද;

(iii) ඉහත කී මුදල් සැබෑ ලෙස වැය කළේ කවර වැය ශීර්ෂ යටතේද;

(iv) ආපදා කළමනාකරණය වෙනුවෙන් මාසිකව වැය කළ මුදල් ප්‍රමාණය සහ එකී මුදල් පවරනු ලැබූ වැය ශීර්ෂයන් කවරේද; සහ

(v) ආපදා කළමනාකරණය සඳහා අයවැයෙන් වෙන්කළ මුදල් පවරනු ලැබූ වැය ශීර්ෂ කවරේද;

යන්න එතුමා වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3011/'12

ගරු බුද්ධික පතිරණ මහතා,— තැපැල් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) තැපැල් දෙපාර්තමේන්තුව විසින් දිගු කලක් තිස්සේ පවත්වා ගෙන යන ලද විදුලි පණිවුඩ (ටෙලිග්‍රෑම්) සේවාව අහෝසි කිරීම සඳහා කටයුතු කරමින් සිටින්නේද;

(ii) එම සේවාව අහෝසි කිරීමේ අරමුණ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) එම සේවාව අහෝසි කළහොත් එම සේවය ලබාගන්නා සාමාන්‍ය ජනතාව සහ රජයේ හා පෞද්ගලික අංශයේ සේවකයින් අපහසුතාවට පත්වන බවත්;

(ii) විදුලි පණිවුඩ සේවාව අහෝසි කිරීමත් සමඟ එම සේවයේ නියුක්තව සිටින්නන්ගේ රැකියාවල සුරක්ෂිතභාවය පිළිබඳ ගැටලු මතුවන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) එසේ නම්, ඔවුන්ගේ රැකියා ආරක්ෂා කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3355/'12

ගරු පී. හැරිසන් මහතා,— වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වනජීවී සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයට අයත් ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් ආයතනය යටතේ ඇති රජයේ වාහන සංඛ්‍යාව කොපමණද;

(iii) එම ආයතනවල රජයේ වාහන ලබාදී ඇති නිලධාරීන් අයත් ශ්‍රේණි කවරේද;

(iv) එම නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) උක්ත අමාත්‍යාංශය යටතේ ඇති ආයතනවලට කුලී පදනම මත ලබා ගෙන වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහනවලට ගෙවීම් කරන ආකාරය කවරේද;

(iii) එම වාහන වෙනුවෙන් වාර්ෂිකව ගෙවන මුළු මුදල කොපමණද;

(iv) කුලී පදනම මත ලබාගත් වාහන පරිහරණය කරනු ලබන නිලධාරීන් කවුරුන්ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත අමාත්‍යාංශය යටතේ ඇති රජයේ වාහන, කුලී පදනම මත ලබාගත් වාහන සහ නිලධාරීන්ගේ පුද්ගලික වාහන වෙන්කර හඳුනාගැනීමේ ක්‍රමවේදයක් තිබේද;

(ii) එසේ නම්, ඒ පිළිබඳ පැහැදිලි කිරීමක් කරන්නේද;

(iii) අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති ආයතනවලට අයත් රජයේ වාහනවල රාජ්‍ය ලාංඡනය සමඟ අදාළ ආයතනයේ නම සඳහන් කර තිබේද;

(iv) නොඑසේ නම්, එයට හේතු කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද ?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

4173/'13

ගරු සුනිල් හඳුන්නෙත්ති මහතා,— මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා මහ බැංකුව, මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය යටතට ගැනෙන ව්‍යවස්ථාපිත ආයතනයක්ද;

(ii) නොඑසේ නම්, එය අමාත්‍යාංශ වගකීමක් රහිත ස්වාධීන ආයතනයක්ද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුවේ,

(i) ප්‍රධාන ගණන් දීමේ නිලධාරියා කවුරුන්ද;

(ii) මුදල් මණ්ඩලයේ කාර්යභාරය කවරේද;

(iii) කළමනාකරණ හා පරිපාලන තීරණවල අවසන් බලධරයා කවුරුන්ද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකා මහ බැංකුවට සේවකයින් බඳවා ගැනීමට අදාළව අනුමත පරිපාටියක් හා වැටුප් ව්‍යුහයක් තිබේද;

(ii) එසේ නම්, එය අනුමත කර ඇති බලධාරිය කවුරුන්ද;

(iii) ඒ සඳහා ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ හා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමතිය ලබා දී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්ය මණ්ඩල වැටුප් ප්‍රතිශෝධනය කරන ආකාරය සහ ඒ සඳහා යොදා ගන්නා නිර්නායකයන් කවරේද;

(ii) ඉහත (ඇ)(i)හි සඳහන් අනුමත බඳවා ගැනීමේ පරිපාටිය හා වැටුප් ව්‍යුහය සහාගත කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# දින නියමයක් නොමැති යෝජනා පිළිබඳ දැනුම්දීම

පා. 194 /'13

ගරු රාජීව විජේසිංහ,— පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග සංශෝධනය,— ස්ථාවර නියෝග අංක 134 ප්‍රකාරව පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග පහත සඳහන් සංශෝධන ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවට යොමුකළ යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:—

1.

අංක 32 (2) ස්ථාවර නියෝගයට ඉක්බිතිවම පහත කොටස ඇතුළත් කරන්න:—

"(3) න්‍යාය පත්‍රයේ සඳහන් ප්‍රශ්න සඳහා පිළිතුරු දීම අදාළ අමාත්‍යවරයා විසින් සිදු කරනු ලැබිය යුතුය. නියමිත දිනයේදී පිළිතුරු ලබාදිය නොහැකි නම්, මාසයක කාලයක් සඳහා කල් ලබා දෙන ලෙස අමාත්‍යවරයාට ඉල්ලා සිටිය හැකිය. ප්‍රශ්නය මතු කරනු ලබන දෙවැනි අවස්ථාවේදී ද පිළිතුරක් නොලැබේ නම්, කථානායකවරයා ප්‍රශ්නය පිළිබඳ තොරුතුරු අදාළ විධායකයේ අංශ ප්‍රධානියා වෙත ලිඛිතව දන්වා, එම ලිපිය ලද දිනයේ සිට සති දෙකක් ඇතුළත පිළිතුරු ලබා දෙන ලෙස ඉල්ලා සිටිය යුතුය."

2.

අංක 45 ස්ථාවර නියෝගය, අංක 45(1) ස්ථාවර නියෝගය වශයෙන් නැවත අංකගත කරන්න.

(1) ඡේදයේ "දිනයක" යන වචනයට ඉක්බිතිවම "එය ඉදිරිපත් කරනු ලබන දිනයට දින දෙකකට නොඅඩු කාලයකට පෙර නොවන දිනයක" යන වචන ඇතුළත් කරන්න.

අංක 45(1) ස්ථාවර නියෝගයට ඉක්බිතිවම පහත කොටස ඇතුළත් කරන්න:—

"(2) සෑම පනත් කෙටුම්පතකම එහි නෛතික බලපෑමේ ප්‍රකාශයක් ඇතුළත් විය යුතුය:

එතෙකුදු වුවත්, කිසිදු පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ කටයුතු සිදුකරනු ලබන භාෂාත්‍රයෙන්ම මන්ත්‍රීන්ට ලබා නොදී සලකා බැලීම සඳහා සාකච්ඡාවට ගනු නොලැබිය යුතුය. එසේ ලබා දෙන බවට වග බලා ගැනීම පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ වගකීම විය යුතු අතර, පනත් කෙටුම්පත සාකච්ඡාවට ගැනීමට පෙර මහ ලේකම්වරයා විසින් කථානායකවරයා වෙත ඒ බව වාර්තා කරනු ලැබිය යුතුය."

අංක 45(2) ස්ථාවර නියෝගයට ඉක්බිතිවම පහත කොටස ඇතුළත් කරන්න:—

"(3) පනත්කෙටුම්පතක් (විසර්ජන පනත් කෙටුම්පත නොවූ) පළමුවැනි වර කියවීමෙන් අනතුරුව නිශ්චිත කාල සීමාවක දී වාර්තාකිරීම පිණිස අදාළ උපදේශක කාරක සභාවට යොමු කරනු ලැබිය යුතුය."

3.

අංක 53 ස්ථාවර නියෝගය අගට පහත කොටස ඇතුළත් කරන්න:—

"කාරක සභාවේදී සලකා බැලීම සඳහා යටත් පිරිසෙයින් දින දෙකක් වත් ලබා දෙන්නේ නම්, නියමිත දිනයකදී වාර්තා කරනු පිණිස කාරක සභාවට නියම කරනු ලැබිය හැකිය. එසේ සලකා බැලීමෙන් පසුව පමණක් පනත් කෙටුම්පත තුන්වැනි වර කියවීම සිදු කළ යුතුය.".

4.

අංක 78අ (2) ස්ථාවර නියෝගය ඉවත් කොට ඒ වෙනුවට පහත කොටස ආදේශ කරන්න:—

"(2) මෙම නියෝගයේ (1) ඡේදයේ දක්වා ඇති යෝජනා සම්මතයක් පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කරනු ලැබූ විට, එම යෝජනා සම්මතයේ දක්වා ඇති විෂම පැවැත්ම හෝ අබලතාව පිළිබඳ චෝදනා සම්බන්ධයෙන් විමර්ශනයක් පවත්වා එහි ප්‍රතිඵල පාර්ලිමේන්තුවට වාර්තා කරනු පිණිස ගණපූරණය මන්ත්‍රීන් තිදෙනෙකුගෙන් සමන්විත හත් දෙනෙකුට නොඅඩු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවකගෙන් යුතු පාර්ලිමේන්තු විශේෂ කාරක සභාවක් කථානායකවරයා විසින් පත්කරනු ලැබිය යුතුය. එවැනි විමර්ශනයක් සිදු කරනු ලැබිය යුත්තේ විශ්‍රාමික

විනිශ්චයකාරවරයෙකු හෝ එක් අයෙකුට වැඩි විශ්‍රාමික විනිශ්චයකාරවරුන්ගෙන් සමන්විත විනිශ්චයාධිකාරයක් විසිනි. එම විනිශ්චයාධිකාරය ඉදිරියේ නඩුව ඉදිරිපත් කිරීම හා සාක්ෂි මෙහෙයවීම සඳහා යම් තැනැත්තෙකු විශේෂ කාරක සභාව විසින් පත් කරනු ලැබිය හැකිය.”

(3) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත කොටස ආදේශ කරන්න:—

“(3) එවැනි විනිශ්චයාධිකාරයක් කාරක සභාව විසින් පවත්වනු ලබන විමර්ශනයට භාජනය වූ චෝදිත විෂම පැවැත්මට හෝ අබලතාවට අදාළ විනිශ්චයකාරවරයා වෙත එම විශේෂ කාරක සභාව පත් කිරීමට අදාළ යෝජනා සම්මතයේ දක්වා ඇති, එකී විනිශ්චයකාරවරයාට එරෙහිව එල්ල කරනු ලැබ ඇති විෂම පැවැත්ම හෝ අබලතාව පිළිබඳ චෝදනාවල පිටපතක් ලබා දිය යුතු අතර, එමගින් නියම කරනු ලබන කාලයක් ඇතුළත ඔහුගේ විත්තිවාචකය පිළිබඳ ලිඛිත ප්‍රකාශයක් ඉදිරිපත් කරන ලෙස නියම කළ යුතුය.”

(4) හා (5) ඡේද ඉවත් කොට ඒ වෙනුවට පහත කොටස ආදේශ කරන්න:—

“(4) මෙම විනිශ්චයාධිකාරයට පුද්ගලයින්, ලිපිලේඛන සහ වාර්තා කැඳවීමටත්, අදාළ විමර්ශනයේ ප්‍රස්තුතය වූ චෝදිත විෂම පැවැත්ම හෝ අබලතාවට අදාළ විනිශ්චයකාරවරයාට පුද්ගලිකවම හෝ නියෝජිතයෙකු මගින් ඒ ඉදිරියේ පෙනී සිටීමට හා ඔහුට එරෙහි නඩුව ඉදිරිපත් කිරීමෙන් හා එම නඩුව ඔප්පු කරනු පිණිස සාක්ෂ්‍යකරුවන්ගේ සාක්ෂ්‍ය ඉදිරිපත් කිරීමෙන් පසුව, විනිශ්චයාධිකාරය ඉදිරියේ දී කරුණු ඉදිරිපත් කිරීමට හා අදාළ චෝදනා නිෂ්ප්‍රභ කරනු පිණිස වාචික හෝ ලේඛනමය සාක්ෂ්‍ය ඉදිරිපත් කිරීමට ඉඩ සැලසීමටත් බලය තිබිය යුතුය.”

(6) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත කොටස ආදේශ කරන්න:—

“(5) විමර්ශනය සමාප්ත වූ විට එම විනිශ්චයාධිකාරය සිය සොයා ගැනීම් විශේෂ කාරක සභාව වෙත වාර්තා කළ යුතු අතර, විශේෂ කාරක සභාව එම සොයා ගැනීම් පිළිබඳව සාකච්ඡාවට භාජනය කොට, ඉදිරිපත් වූ සාක්ෂ්‍යවල කාර්යසටහන්ද සමගින්, සිය නිර්දේශයන්ද සහිත වාර්තාවක් එහි කාර්යසැසි ආරම්භවීමෙන් මාසයක කාලයක් ඇතුළත පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු අතර, පාර්ලිමේන්තුවේ අවධානයට යොමු කිරීමට සුදුසු යැයි තමන් සිතන යම් කාරණා සම්බන්ධයෙන් වූ විශේෂ වාර්තාවක් ඉදිරිපත් කිරීමටද එම කාරක සභාවට හැකිය.

එසේකුදු වුවත්, මෙහි සඳහන් කාල සීමාව ඇතුළත පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට විශේෂ කාරක සභාවට නොහැකි වේ නම්, තවදුරටත් විශේෂිත කාල සීමාවක් සඳහා හේතු දක්වමින් එසේ කාලය දීර්ඝ කරන ලෙස පාර්ලිමේන්තුවේ අවසරය ඉල්ලා සිටිය යුතු අතර, අවශ්‍ය යැයි හැඟී යන පරිද්දෙන් එවැනි කාලය දීර්ඝ කිරීමක් ලබා දීමට පාර්ලිමේන්තුවට හැකි වන්නේය.”

(7) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත කොටස ආදේශ කරන්න:—

“(6) විනිශ්චයාධිකාරයේ වාර්තාව සහ විශේෂ කාරක සභාවේ නිර්දේශය සලකා බැලීමෙන් පසුව, ඔප්පු කරන ලද විෂම පැවැත්ම හෝ අබලතාව හේතුවෙන් විනිශ්චයකාරවරයෙකු ඉවත් කිරීම සඳහා ජනාධිපතිවරයා වෙත කෙරෙන ඇමතීමක් සඳහා වූ අදාළ යෝජනා සම්මතය පිළිබඳව ඡන්දය ප්‍රකාශ කිරීමට පාර්ලිමේන්තුවට හැකි වන අතර එම යෝජනා සම්මතය පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබුවහොත්, එම ඇමතීම,

පාර්ලිමේන්තුව වෙනුවෙන් කථානායකවරයා විසින් ජනාධිපතිවරයාට ඉදිරිපත් කරනු ලැබිය යුතුය.”.

5.

අංක 78ආ (2) ස්ථාවර නියෝගය ඉවත් කොට ඒ වෙනුවට පහත කොටස ආදේශ කරන්න:—

“(2) මෙම නියෝගයේ (1) ඡේදයේ දක්වා ඇති යෝජනා සම්මතයක් පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රයට ඇතුළත් කරනු ලැබූ විට, එම යෝජනා සම්මතයේ දක්වා ඇති විෂම පැවැත්ම හෝ අබලතාව පිළිබඳ චෝදනා සම්බන්ධයෙන් විමර්ශනයක් ක්‍රියාත්මක කොට එහි ප්‍රතිඵල පාර්ලිමේන්තුවට වාර්තා කරනු පිණිස ගණපූරණය මන්ත්‍රීන් තිදෙනෙකුගෙන් සමන්විත හත් දෙනෙකුට නොඅඩු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවකගෙන් යුතු විශේෂ කාරක සභාවක් කථානායකවරයා විසින් පත් කරනු ලැබිය යුතුය. එවැනි විමර්ශනයක් සිදු කරනු ලැබිය යුත්තේ විශ්‍රාමික විනිශ්චයකාරවරයෙකු හෝ එක් අයෙකුට වැඩි විනිශ්චයකාරවරුන්ගෙන් සමන්විත විනිශ්චයාධිකාරයක් විසිනි. එම විනිශ්චයාධිකාරය ඉදිරියේ නඩුව හා සාක්ෂි ඉදිරිපත් කිරීම සඳහා යම් තැනැත්තෙකු විශේෂ කාරක සභාව විසින් පත් කරනු ලැබිය හැකිය.”

(3) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත කොටස ආදේශ කරන්න:—

“(3) එවැනි විනිශ්චයාධිකාරයක් විසින් සිය විමර්ශනයට යොමු කරනු ලැබ ඇති විෂම පැවැත්ම හෝ අබලතාව පිළිබඳ චෝදනාවලට ලක්වූ මෙම නියෝගයේ (1) ඡේදයේ සඳහන් තැනැත්තා වෙත එම තැනැත්තාට විරුද්ධව එල්ල කර ඇත්තාවූත්, එම විශේෂ කාරක සභාව පත් කරනු ලැබීමට මුල් වූ යෝජනා සම්මතයේ දක්වා ඇත්තාවූත් විෂම පැවැත්ම හෝ අබලතාව හෝ පිළිබඳ චෝදනාවල පිටපතක් යවා විශේෂ කාරක සභාව විසින් නියම කරනු ලබන කාලපරිච්ඡේදයක් ඇතුළත ඔහුගේ විත්තිවාචකය පිළිබඳ ලිඛිත ප්‍රකාශයක් ඉදිරිපත් කරන ලෙස එම තැනැත්තාට නියම කළ යුතුය.”

(4) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත කොටස ආදේශ කරන්න:—

“(4) මෙම විනිශ්චයාධිකාරයේ විමර්ශනයට විෂයය වූ විෂම පැවැත්ම හෝ අබලතාව හෝ පිළිබඳව චෝදනාවලට ලක් වූ තැනැත්තාට එකී විනිශ්චයාධිකාරය ඉදිරියේ පුද්ගලිකවම හෝ නියෝජිතයෙකු මගින් හෝ පෙනී සිටීමට ද, කරුණු කියා සිටීමට ද, තමන්ට එරෙහිව නඟා ඇති නඩුවේ ආරම්භය සහ එම නඩුව තහවුරු කිරීමට ඇති සාක්ෂිකරුවන්ගේ සාක්ෂි අනුව ඔහුට විරුද්ධව නඟා ඇති චෝදනා විසාධනය කිරීම සඳහා වාචික හෝ ලේඛනමය සාක්ෂි ඉදිරිපත් කිරීමට එම තැනැත්තාට අවස්ථාව දෙන අතරම තමන් වෙත පුද්ගලයින් කැඳවීමට ද, ලේඛන හා වාර්තා ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට ද බලය තිබිය යුතුය.”

(5) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත කොටස ආදේශ කරන්න:—

“(5) විමර්ශනය සමාප්ත වූ විට එම විනිශ්චයාධිකාරය සිය සොයා ගැනීම් විශේෂ කාරක සභාව වෙත වාර්තා කළ යුතු අතර, විශේෂ කාරක සභාව එම සොයා ගැනීම් පිළිබඳව සාකච්ඡාවට භාජනය කොට, ඉදිරිපත් වූ සාක්ෂිවල කාර්යසටහන්ද සමගින්, සිය නිර්දේශයන්ද සහිත වාර්තාවක් එහි කාර්යසැසි ආරම්භවීමෙන් මාසයක කාලයක් ඇතුළත පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු අතර, පාර්ලිමේන්තුවේ අවධානයට යොමු කිරීමට සුදුසු යැයි තමන් සිතන යම් කාරණා සම්බන්ධයෙන් වූ විශේෂ වාර්තාවක් ඉදිරිපත් කිරීමටද එම කාරක සභාවට හැකිය.

එතෙකුදු වුවත්, මෙහි සඳහන් කාලය ඇතුළත පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට විශේෂ කාරක සභාවට නොහැකි වේ නම්, තව දුරටත් විශේෂිත කාල සීමාවක් සඳහා හේතු දක්වමින් එසේ කාල සීමාව දීර්ඝ කරන ලෙස පාර්ලිමේන්තුවේ අවසරය ඉල්ලා සිටිය යුතු අතර, අවශ්‍ය යැයි හැඟී යන පරිද්දෙන් එවැනි කාලය දීර්ඝ කිරීමක් ලබා දීමට පාර්ලිමේන්තුවට හැකි වන්නේය.”.

(6) ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත කොටස ආදේශ කරන්න:—

“(6) විනිශ්චයාධිකාරයේ වාර්තාවේ සඳහන් සලකා බැලීම් සහ විශේෂ කාරක සභාවේ නිර්දේශ අනුව ඔප්පු වී ඇති විෂම පැවැත්මක් හෝ අබලතාවක් ඇති බවට සනාථ වූ තැනැත්තෙකු එම ධූරයෙන් ඉවත් කරනු ලැබීම සඳහා ජනාධිපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලබන යෝජනාවක් සම්බන්ධයෙන් වූ යෝජනා සම්මතයක් සඳහා පාර්ලිමේන්තුවට ඡන්දය භාවිතා කළ හැකි වන අතර එවැනි යෝජනා සම්මතයක් පාර්ලිමේන්තුවේ සම්මත වූ කල්හි, කථානායකවරයා විසින් පාර්ලිමේන්තුව වෙනුවෙන් එම යෝජනාව ජනාධිපතිවරයාට ඉදිරිපත් කරනු ලැබිය යුත්තේය.”.

6.

104 සිට 115 දක්වා ඡේද ඉවත් කොට ඒ වෙනුවට පහත කොටස ආදේශ කරන්න:—

**“උපදේශක කාරක සභා**

104.

ආණ්ඩුවේ යම් යම් කටයුතුවලට අදාළ අමාත්‍යාංශ එකක් හෝ වැඩි ගණනක් සඳහා පාර්ලිමේන්තු උපදේශක කාරක සභා පත් කළ හැකිය. පනත් කෙටුම්පත්, නීති සම්පාදනය සඳහා යෝජනා, පරිපූරක හෝ අනෙකුත් ඇස්තමේන්තු, වියදම් ප්‍රකාශ, යෝජනා, වාර්ෂික වාර්තා හෝ ලේඛන ආදී අමාත්‍යාංශවලට අදාළ සියලුම කාරණාවලට සම්බන්ධ කටයුතු පිළිබඳ විමර්ශනය කිරීම සහ වාර්තා කිරීම ඒවායේ රාජකාරි වලට ඇතුළත් වේ. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු සහ අමාත්‍යාංශවල ඔවුන්ගේ නිලධාරින් මගින් අමාත්‍යවරු සිදුකරවාගත යුතුයැයි බලාපොරොත්තු වන කාරණාවලට අදාළ කටයුතු මෙහිදී සැලකිල්ලට නොගත යුතුය. අදාළ අමාත්‍යවරයාගේ උපදෙස් සහිතව ඕනෑම පනත් කෙටුම්පතක් හෝ යෝජනාවක් සඳහා මුල පිරීමේ බලය උපදේශක කාරක සභාවකට තිබිය යුතුය.

105.

ඉහත සඳහන් කාර්යයන් සඳහා ප්‍රමාණවත් අවධානයක් යොමු වීම සහතික කරලනු වස්, අවශ්‍ය උපදේශක කාරක සභා සංඛ්‍යාව සෑම පාර්ලිමේන්තු සැසිවාරයක් ආරම්භයේදීම තේරීම් කාරක සභාව විසින් තීරණය කර එම පත්කිරීම් සිදුකරනු ලැබිය යුතුය. විශේෂයෙන්ම පහත සඳහන් ක්ෂේත්‍ර ආවරණය කිරීම සඳහා කාරක සභා පත් කරනු ලැබිය යුතු අතර එම කාරක සභාවල විෂය පථය යටතේ එම ක්ෂේත්‍රවලට වගකියන සියලුම අමාත්‍යාංශවලට අදාළ කාරණා සාකච්ඡා කරනු ලැබිය යුතුය:—

1. රාජ්‍ය ආරක්ෂාව
2. විදේශ කටයුතු
3. ආර්ථික සංවර්ධනය
4. අධ්‍යාපනය සහ මානව සම්පත් සංවර්ධනය

5. රාජ්‍ය පරිපාලන සහ පළාත් පාලන
6. අධිකරණ
7. මුදල්
8. සෞඛ්‍යය
9. ප්‍රවාහන සහ මහාමාර්ග
10. පරිසරය සහ ආපදා කළමනාකරණ
11. වාරිමාර්ග සහ ජල කළමනාකරණ
12. කෘෂිකර්ම, ධීවර සහ පශු සම්පත් සංවර්ධන
13. කර්මාන්ත
14. මානව අයිතිවාසිකම් සහ ප්‍රතිසන්ධානය
15. ගුවන් සේවා සහ නාවික
16. බලශක්ති, ඛනිජ තෙල් සහ ඛනිජ සම්පත්
17. පුරාවිද්‍යා, ජාතික උරුමයන් සහ සංස්කෘතික කටයුතු
18. ජනමාධ්‍ය
19. තැපැල් සහ විදුලි සංදේශ
20. කම්කරු
21. වෙළෙඳ සහ සමූපකාර
22. ඉඩම් සහ නාගරික සංවර්ධන

තේරීම් කාරක සභාව විසින් අනෙකුත් උපදේශක කාරක සභා පත්කළ හැකි අතර වාර්ෂිකව එම කාරක සභාවල වාර්තා නැවත අලුත් කිරීම සහ එම කාරක සභාවල සංයුතිය අවශ්‍ය පරිදි වෙනස් කිරීම සිදු කරනු ලැබිය හැකිය.

106.

එක් එක් කාරක සභාව යටතේ එන විෂයයන් භාර අමාත්‍යවරයාගේ හෝ අමාත්‍යවරයන්ගේ අදහස් විමසීමෙන් අනතුරුව තේරීම් කාරක සභාව විසින් ඒ ඒ උපදේශක කාරක සභාවේ සභාපතිවරයන් පත් කරනු ලැබිය යුතුය. අමාත්‍යවරයන් හෝ නියෝජ්‍ය අමාත්‍යවරයන් උපදේශක කාරක සභාවල සභාපතිවරයන් නොවිය යුතු අතර එකී කාරක සභාවන්ගෙන් අවම වශයෙන් හරි අඩකවත් සභාපතිවරයන් විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරයන් විය යුතුය. උපදේශක කාරක සභාවේ ගණපූරණය සභික මන්ත්‍රීවරුන් තිදෙනෙකුගෙන් සමන්විත විය යුතුය. ගණපූරණය නොමැති අවස්ථාවකදීත් සාකච්ඡා පැවැත්විය හැකි වුවද, ගණපූරණය සහිත කාරක සභා රැස්වීමකදී අනුමත වුවහොත් මිස එවන් සාකච්ඡා කාරක සභාවේ නිල කටයුතුවල කොටසක් නොවිය යුතුය.

107.

සෑම උපදේශක කාරක සභාවක්ම පස් දෙනෙකුට නොඅඩු හා පහළොස් දෙනෙකුට නොවැඩි සභික මන්ත්‍රීවරයන් සංඛ්‍යාවකින් සමන්විත විය යුතු අතර එම සභික මන්ත්‍රීවරයන් තේරීම් කාරක සභාව විසින් පත් කරනු ලැබිය යුතුය. කිසිදු මන්ත්‍රීවරයෙකු උපදේශක කාරක සභා තුනකට වැඩි සංඛ්‍යාවකට අයත් නොවිය යුතු නමුත් (පහත අංක 108 ස්ථාවර නියෝගයේ අවශ්‍යතාවයන් ඉටු කිරීම සඳහා හැර) තමන්

සභිකයෙකු නොවන උපදේශක කාරක සභාවක රැස්වීමකට සහභාගී වීමට ඕනෑම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකුට ඉඩකඩ තිබිය යුතුය. එසේවුවද, එම කාරක සභාවේ සභාපතිවරයා ඉල්ලා සිටි විට එම මන්ත්‍රීවරයා එම ස්ථානයෙන් ඉවත් විය යුතුය.

108.

සෑම උපදේශක කාරක සභාවක් තුළම යටත් පිරිසෙයින් පාර්ලිමේන්තුව නියෝජනය කරනු ලබන සෑම පක්ෂයකින්ම එක් සභික මන්ත්‍රීවරයෙකු හෝ සිටිය යුතු අතර හැකි සෑම අවස්ථාවකදීම ඒවා පාර්ලිමේන්තුවේ පක්ෂ සංයුතිය නිරූපනය කරන ආකාරයෙන් විය යුතුය. කාරක සභා පහක සේවය කිරීම සඳහා අයදුම් කරන මන්ත්‍රීවරයන්ගේ මනාපය මත පදනම්ව තේරීම් කාරක සභාව විසින් උපදේශක කාරක සභා සඳහා පත්වීම් සිදු කරනු ලැබිය යුතුය.

109.

සෑම කාරක සභාවක්ම යටත් පිරිසෙයින් මාසයකට වරක්වත් රැස්විය යුතු අතර විශේෂ වැදගත්කමක් සහිත කරුණු කාරක සභාවේ අනු කාරක සභා මගින් සාකච්ඡා කිරීම සඳහා අවකාශය අමාත්‍යවරයා හෝ අමාත්‍යවරයන් විසින් සලසා දෙනු ලැබිය යුතුය. එවැනි සාකච්ඡා අමාත්‍යාංශයේදී පැවැත්විය යුතු අතර එම කාර්යය සඳහා වන අනු කාරක සභාවක්, අදාළ උපදේශක කාරක සභාව නියෝජනය කරනු ලබන සෑම පක්ෂයක්ම නියෝජනය වන පරිදි සභාපතිවරයා විසින් නම් කරනු ලැබිය යුතුය.

110.

යෝජනා කරනු ලබන්නාවූ පනත් කෙටුම්පත් හි විෂයයන් භාර අමාත්‍යවරයන් විසින් එම සියලුම පනත් කෙටුම්පත් අදාළ උපදේශක කාරක සභාවේ නිරීක්ෂණ සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර එම පනත් කෙටුම්පත් සාකච්ඡාවට භාජනය කෙරෙන විශේෂ රැස්වීම්වල මූලාසනය දරනු ලැබිය යුතුය.

111.

උපදේශක කාරක සභාවේ සභික මන්ත්‍රීවරයෙකු මියගියහොත්, ඉල්ලා අස්වුවහොත් හෝ සාමාජිකත්වය හැර ගිය අවස්ථාවක එම සභික මන්ත්‍රීවරයා වෙනුවට උපදේශක කාරක සභාවට වෙනත් මන්ත්‍රීවරයකු තේරීම් කාරක සභාව විසින් පත් කරනු ලැබිය හැකිය. කාරක සභාව අවශ්‍ය යැයි තීරණය කරනු ලැබූ විටෙක ඕනෑම සභික මන්ත්‍රීවරයෙකු ඕනෑම උපදේශක කාරක සභාවකින් ඉවත් කොට ඒ වෙනුවට වෙනත් මන්ත්‍රීවරයකු පත්කිරීමට තේරීම් කාරක සභාවට බලය ඇත්තේය. මෙම නියෝගය යටතේ සෑම පත්කිරීමක්ම ඊළඟ පාර්ලිමේන්තු සභාවාරයේදී නිවේදනය කරනු ලැබිය යුතුය.

112.

යම් සභික මන්ත්‍රීවරයෙකු ස්වකීය අත්සනින් යුතු අයදුම්පත්‍රයක් කාරක සභාව වෙත ඉදිරිපත් කරමින් කාරක සභාවේ පූර්ව අනුමතිය ලබා නොගෙන පිට පිටම රැස්වීම් තුනකට නොපැමිණියහොත් ඔහු එකී කාරක සභාවේ දැරූ සභිකත්වය අත්හැර ගියා සේ සැලකිය යුතු අතර තේරීම් කාරක සභාව එකඟ නොවන්නේ නම් එම සැසිවාරය තුළ එකී කාරක සභාවට නැවත පත් නොකළ යුත්තේය:

එතෙකුදු වුවත්, සභික මන්ත්‍රීවරයෙකු පාර්ලිමේන්තුවේ පූර්ව අවසරය ලබා ගෙන පාර්ලිමේන්තු රැස්වීම්වලට සහභාගී නොවී සිටින

කාල සීමාව තුළ යම් දිනයක එකී කාරක සභාවේ රැස්වීම් පැවැත්වෙන්නේ නම් ඉහත සඳහන් විධිවිධාන අදාළ නොවන්නේය.

113.

උපදේශක කාරක සභාවේ සභාපතිවරයා හා අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අදහස් විමසමින් උපදේශක කාරක සභාවේ රැස්වීම් යටත් පිරිසෙයින් මාසයකට වරක්වත් කැඳවන බවටත්, ඵලදායි වැඩසටහන් සකස් කර ගන්නා බවටත් පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා විසින් වගබලා ගත යුතුය. අදාළ සෑම අමාත්‍යාංශයකම ලේකම්වරයා හෝ ඔහු නියෝජනය කරනු ලබන අතිරේක ලේකම්වරයකු උපදේශක කාරක සභාවේ සෑම රැස්වීමකටම සහභාගී විය යුතු අතර එවැනි රැස්වීමකදී ඉල්ලා සිටිනු ලබන තොරතුරු හා වාර්තා එකී රැස්වීමෙන් සතියක කාලයක් ඇතුළත සපයා දීමටත් වගබලා ගත යුතුය.

යම් උපදේශක කාරක සභාවක යටතේ පිරිසෙයින් සභික මන්ත්‍රීන් තිදෙනෙකු විසින් ලිඛිත ඉල්ලීමක් කරනු ලැබුවහොත් එම උපදේශක කාරක සභාවේ රැස්වීම් හැකි ඉක්මනින් කැඳවනු ලැබිය යුතුය.

114.

පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන වෙනත් ඕනෑම නිලධාරියෙකු එකී සෑම කාරක සභාවකම ලේකම්වරයා ලෙස කටයුතු කළ යුතුය. ඔහුගේ වගකීම් හා කාර්යයන් ඉටුකිරීම සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය, පහසුකම් හා සම්පත් අවශ්‍ය පරිදි ඔහු වෙත සපයා දිය යුතුය. රැස්වීම් පැවැත්වීමෙන් සතියක කාලයක් ඇතුළත රැස්වීම්වල කාර්ය සටහන් සකස් කිරීම හා කාරක සභාවේ මීළඟ රැස්වීමේදී අනුමත කර ගැනීම සඳහා ඉදිරිපත් කිරීමට පෙරාතුව පැහැදිලි කර ගැනීම හා අනුමතිය සඳහා එකී කාර්ය සටහන්වල පිටපත් සභාපතිවරයාට, අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයාට හා අදාළ අමාත්‍යවරයා වෙත ලබාදීම එම වගකීම් හා කාර්යයන්වලට ඇතුළත් වන්නේය.

115.

එක් එක් අමාත්‍යාංශයට අදාළ සෑම වාර්තාවක්ම උපදේශක කාරක සභාවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතුය. ඊට අතිරේක වශයෙන්, පාර්ලිමේන්තුව විසින් උපදේශක කාරක සභාව වෙත යොමු කරන ලද කරුණක් සම්බන්ධයෙන් ඕනෑම වාර්තාවක්, එවැනි යොමු කිරීමකින් මාස තුනක කාලසීමාවක් ඇතුළත සභාපතිවරයා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු අතර, පාර්ලිමේන්තුව විසින් අවශ්‍යයැයි සලකන්නේ නම් එහි ඕනෑම කොටසක් තවදුරටත් සලකා බැලීමට යෝජනා කරනු ලැබිය හැකිය. කාරක සභාවක යම් සභික මන්ත්‍රීවරයෙකුගේ වෙනත් මතයක් ඇතොත් එයද වාර්තාවට ඇතුළත් කළ යුතුය:

එසේකුදු වුවත්, අදාළ කරුණු සම්බන්ධව උපදේශක කාරක සභවේ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන තෙක්, උපදේශක කාරක සභාවට යොමු කරන ලද කරුණු පාර්ලිමේන්තුව විසින් සලකාබැලීම සඳහා නොගත යුතුය.

යම් යම් පුද්ගලයන් කැඳවීමට, ලිපි ලේඛනාදිය හා වාර්තා ගෙන්වා ගැනීමට හා පරීක්ෂා කිරීමට, උපදේශක කාරක සභාව වෙත යොමු කොට ඇති හෝ එහි විෂයය පථය යටතේ ගැනෙන කරුණක් පූර්ණ වශයෙන් සලකා බැලීම සඳහා ස්ථානයෙන් ස්ථානයට යාම හෝ වෙනත් අදාළ

ක්‍රියාකාරකම් සිදුකිරීමට සහ පාර්ලිමේන්තුව කල්තබා තිබියදී වුවද රැස්වීමට, කාරක සභාවට බලය තිබිය යුත්තේය:

එසේම, අදාළ අමාත්‍යවරයාගේ තීරණය ප්‍රකාර, එවැනි පුද්ගලයින් කැඳවීමට, ලිපිලේඛනාදිය හා වාර්තා ගෙන්වා ගැනීමට නොහැකි වුවහොත් අමාත්‍යවරයා විසින් එය ලිඛිතව පැහැදිලි කරනු ලැබිය යුතු අතර අදාළ කරුණු අමාත්‍යවරයා සමග සාකච්ඡා කිරීමට කාරක සභාවට අවස්ථාව ලබා දිය යුතුය.”

7.

අංක 125 (1) ස්ථාවර නියෝගයේ අගට පහත කොටස ඇතුළත් කරන්න:—

“මුදල් විෂය භාර අමාත්‍යවරයා සමග සාකච්ඡා කොට කථානායකවරයා විසින් පත්කරනු ලබන කාරක සභා සභාපතිවරයෙකු සහ නියෝජ්‍ය සභාපතිවරයෙකු සිටිය යුතුය. සභාපතිවරයා හෝ නියෝජ්‍ය සභාපතිවරයා, අමාත්‍යවරයෙකු හෝ ව්‍යාපෘති අමාත්‍යවරයෙකු හෝ නියෝජ්‍ය අමාත්‍යවරයෙකු නොවිය යුතු අතර, සභාපතිවරයා විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරයෙකු ද නියෝජ්‍ය සභාපතිවරයා ආණ්ඩු පාර්ශ්වයේ මන්ත්‍රීවරයෙකු ද විය යුතුය.”

(6) ඡේදයට ඉක්බිතිවම පහත කොටස ඇතුළත් කරන්න:—

“(7) රජයේ ගිණුම් කාරක සභාව විසින් පහත සඳහන් කරුණු පිළිබඳ නිර්දේශයන් ඇතුළත් විය හැකි වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතුය:—

(i) ප්‍රතිපත්තීන්හි සිදු කරන වෙනස්කිරීම්

(ii) ආයතනික හෝ කළමනාකරණ ක්‍රියා පටිපාටීන්හි සිදුකරන වෙනස්කිරීම්

(iii) ව්‍යාපෘති හා වැඩසටහන් අත්හිටුවීම

(iv) නිලධාරීන්ට වගකීම් පැවරීම

(v) විනය ක්‍රියා පටිපාටි පැනවීම

(vi) අපරාධ වගකීමක් පිළිබඳව හෙළිදරවු වූ විට අදාළ බලධාරීන් වෙත යොමු කිරීම

වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කර මුදල් විෂය භාර අමාත්‍යවරයා වෙත යවනු ලබන අතර අමාත්‍යවරයා විසින් මාසයක් ඇතුළත වාර්තාවට ප්‍රතිචාර දක්වා, ක්‍රියාත්මක කිරීමට අදාළ කාල රාමුවක් ද සහිතව කවර නිර්දේශයන් පිළිගනු ලබන්නේද යන්න දක්වනු ලැබිය යුතුය. ක්‍රියාත්මක කළ නොහැකි නිර්දේශයන් සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් සපයනු ලබන අතර, එලෙස මතුකරන ලද ගැටලු සම්බන්ධයෙන් ඒ වෙනුවට ගනු ලබන ප්‍රතිකර්මීය පියවර පිළිබඳ විස්තරයක්ද ඒ සමග සපයනු ලැබිය යුතුය.

එවැනි ප්‍රතිචාරයකින් පසුව වාර්තාව පාර්ලිමේන්තුව විසින් සාකච්ඡාවට භාජනය කරනු ලබන සංශෝධනවලින් අනතුරුව සුදුසු වේ යැයි සැලකේ නම්, අනුමත කරනු ලබන අතර, එවැනි වාර්තාවක ඇති නිර්දේශ ඒවා ක්‍රියාත්මක කර මාස හයක කාල පරිච්ඡේදයක් තුළ නැවත පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා වගකිවයුතු ආණ්ඩුව වෙත කරනු ලබන නිර්දේශ ලෙස සලකනු ලැබිය යුතුය. එවැනි වාර්තා නිසි කලට ඉදිරිපත් කරන බවට කථානායකවරයා විසින් සහතික කරගනු ඇති අතර සිදුවන ප්‍රමාදයන් පිළිබඳව විධායකයේ ප්‍රධානියාට දැනුම්දෙනු ලැබිය යුතුය.

(8) සිය අත්සන සහිතව සිදු කරන අයැදුම් කිරීමක් මත එම කාරක සභාවේ පූර්ව අවසර ලබා නොගෙන කාරක සභාවේ අනුගාමී රැස්වීම් තුනකට සහභාගී නොවන ඕනෑම සභික මන්ත්‍රීවරයෙකු එම කාරක සභාවේ සිය සාමාජිකත්වය අතහැර ගියා සේ සලකනු ඇති අතර, තේරීම් කාරක සභාව විසින් එකඟ වුවහොත් හැර, එම සැසි වාරය තුළදී අදාළ කාරක සභාව සඳහා යළි පත් කරනු නොලැබිය යුතුය.”

8.

අංක 126 (1) ස්ථාවර නියෝගය අගට පහත කොටස ඇතුළත් කරන්න:—

“මුදල් විෂය භාර අමාත්‍යවරයා සමග සාකච්ඡා කොට කථානායකවරයා විසින් පත්කරනු ලබන කාරක සභා සභාපතිවරයෙකු සහ නියෝජ්‍ය සභාපතිවරයෙකු සිටිය යුතුය. සභාපතිවරයා හෝ නියෝජ්‍ය සභාපතිවරයා, අමාත්‍යවරයෙකු හෝ ව්‍යාපෘති අමාත්‍යවරයෙකු හෝ නියෝජ්‍ය අමාත්‍යවරයෙකු නොවිය යුතු අතර, සභාපතිවරයා විරුද්ධ පාර්ශ්වයේ මන්ත්‍රීවරයෙකු ද නියෝජ්‍ය සභාපතිවරයා ආණ්ඩු පාර්ශ්වයේ මන්ත්‍රීවරයෙකු ද විය යුතුය.”

(6) ඡේදයට ඉක්බිතිවම පහත කොටස් ඇතුළත් කරන්න:—

“(7) පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් පහත දැක්වෙන කරුණු පිළිබඳව නිර්දේශයන් ඇතුළත් විය හැකි වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කරනු ඇත.

(i) ප්‍රතිපත්තීන්හි සිදු කරන වෙනස්කිරීම්

(ii) ආයතනික හෝ කළමනාකරණ ක්‍රියා පටිපාටීන්හි සිදුකරන වෙනස්කිරීම්

(iii) ව්‍යාපෘති හා වැඩසටහන් අත්හිටුවීම

(iv) නිලධාරීන්ට වගකීම් පැවරීම

(v) විනය ක්‍රියා පටිපාටි පැනවීම

(vi) අපරාධ වගකීමක් පිළිබඳව හෙළිදරවු වූ විට අදාළ බලධාරීන් වෙත යොමු කිරීම

වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කොට මුදල් විෂය භාර අමාත්‍යවරයා වෙත යවනු ලබන අතර අමාත්‍යවරයා විසින් මාසයක් ඇතුළත වාර්තාවට ප්‍රතිචාර දක්වා, ක්‍රියාත්මක කිරීමට අදාළ කාල රාමුවක් ද සහිතව කුමන නිර්දේශයන් පිළිගනු ලබන්නේද යන්න දක්වනු ලැබිය යුතුය. ක්‍රියාත්මක කළ නොහැකි නිර්දේශයන් සම්බන්ධයෙන් පැහැදිලි කිරීමක් සපයනු ලබන අතර, එලෙස මතු කරන ලද ගැටලු සම්බන්ධයෙන් ඒ වෙනුවට ගනු ලබන ප්‍රතිකර්මීය පියවර පිළිබඳ විස්තරයක්ද ඒ සමග සපයනු ලැබිය යුතුය.

එවැනි ප්‍රතිචාරයකින් පසුව වාර්තාව පාර්ලිමේන්තුව විසින් සාකච්ඡාවට භාජනය කර, සංශෝධනවලින් අනතුරුව සුදුසු වේ යැයි සැලකේ නම්, අනුමත කරන අතර, එවැනි වාර්තාවක ඇති නිර්දේශ, ඒවා ක්‍රියාත්මක කර මාස හයක කාල පරිච්ඡේදයක් තුළ නැවත පාර්ලිමේන්තුවට වාර්තා කිරීම සඳහා වගකිවයුතු ආණ්ඩුව වෙත කරනු ලබන නිර්දේශ ලෙස සලකනු ලැබිය යුතුය. එවැනි වාර්තා නිසි කලට ඉදිරිපත් කරන බවට කථානායකවරයා විසින් සහතික කරගනු ඇති අතර සිදුවන ප්‍රමාදයන් පිළිබඳව විධායකයේ ප්‍රධානියාට දැනුම්දෙනු ලැබිය යුතුය.

(8) සිය අත්සන සහිතව සිදු කරන අයදුම්කිරීමක් හරහා එම කාරක සභාවේ පූර්ව අවසර ලබා නොගෙන කාරක සභාවේ අනුගාමී රැස්වීම් තුනකට සහභාගී නොවන ඕනෑම සාමාජික මන්ත්‍රීවරයෙකු එම කාරක සභාවේ සිය සාමාජිකත්වය අතහැර ගියා සේ සලකනු ඇති අතර, තේරීම් කාරක සභාව විසින් එකඟ වුවහොත් හැර, එම සැසිවාරය තුළදී අදාළ කාරක සභාව සඳහා යළි පත් කරනු නොලැබිය යුතුය.''

9.

අංක 128(5) ස්ථාවර නියෝගය අගට පහත කොටස ඇතුළත් කරන්න:—

''පාර්ලිමේන්තුවේදී සම්මතවූ වාර්තාව ඉන්පසුව විධායකයේ ප්‍රධානියා වෙත යවනු ලබන අතර, වාර්තාවේ මතුකර ඇති කරුණු සම්බන්ධයෙන් ගෙන ඇති ක්‍රියාමාර්ග සහ වාර්තාවේ සටහන් කර ඇති අඩුපාඩු යළි සිදුවීම වැළැක්වීම සඳහා ගැනීමට බලාපොරොත්තු වන ක්‍රියාමාර්ග පිළිබඳව මාස තුනක් ඇතුළත යළි වාර්තා කරනු ලැබිය යුතුය.''

10.

අංක 128අ(3) සහ (4) ස්ථාවර නියෝග ඉවත් කර ඒවා වෙනුවට පහත කොටස ආදේශ කරන්න:—

''(3) කාරක සභාව විසින් විමර්ශනයට ලක්කරන ලද තැනැත්තන් පිළිබඳව සහ කාරක සභාවේ නිර්දේශ පිළිබඳ වාර්තාවක් සෑම කාර්තුවකදීම කාරක සභාව විසින් පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතුය. කාරක සභාවේ තීරණ පිළිබඳව ප්‍රශ්න ඇසීමට අවස්ථාව ලබා දීමෙන් පසු වාර්තාව පිළිගත යුතුය.

(4) කාරක සභාවේ ගණපූරණය සාමාජිකයින් හතර දෙනෙකු විය යුතු අතර පාර්ලිමේන්තුවේ සභා වාරය අවසන් කර තිබියදී පවා කාරක සභාවට එහි කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යා හැකිය.

(5) තම අත්සන යොදා ඉදිරිපත් කරන ලද අයදුම්පත්‍රයක් මගින් කාරක සභාවේ පූර්ව අවසරය ලබා නොගෙන නොකඩවා කාරක සභාවේ රැස්වීම් වාර දෙකකට සහභාගී නොවන ඕනෑම සාමාජිකයෙකු එම කාරක සභාවේ සාමාජිකත්වය අතහැර ගියා සේ සලකනු ලබන අතර තේරීම් කාරක සභාව විසින් එකඟ නොවෙන්නේ නම්, එම සභාවාරය තුළදී නැවත වරක් එම කාරක සභාවේ සාමාජිකයෙකු ලෙස පත් නොකළ යුතුය.

(6) (2) ඡේදයේ සිට (5) ඡේදය දක්වා වූ විධිවිධානයන් පාර්ලිමේන්තු සභාවට ද අදාළ විය යුතුය:

එසේ වුවත් සාමාජිකයන් තම ධුරය දැරීමේ ප්‍රතිඵලයක් ලෙස සාමාජිකත්වය දරන අවස්ථාවලදී පහත සඳහන් පරිදි ඒ වෙනුවට වෙනත් අයෙකු විසින් සාමාජිකත්වයේ කටයුතු කරනු ලැබිය හැකිය:—

කථානායකවරයා වෙනුවට නියෝජ්‍ය කථානායකවරයා

අග්‍රාමාත්‍යවරයා වෙනුවට සභානායකවරයා

විරුද්ධ පාර්ශ්වයේ නායකයා වෙනුවට පාර්ලිමේන්තුවේ ඊළඟ වැඩිම නියෝජනය සහිත පක්ෂයේ නායකයා.''

11.

අංක 132 ස්ථාවර නියෝගයේ ''රජයේ ගිණුම් කාරක සභාව'' යන වචන යෙදෙන සෑම තැනකම ''හෝ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව'' යන වචන අදාළ පරිදි ඇතුළත් කරන්න.